# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත

---

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 ජූලි මස 05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන්
පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 56.00 යි.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම;

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබනු විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරත තැනැත්තන් අතර ඵලදායී තරගකාරීත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම;

(ඊ) අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන්ගේ හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම;

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳව පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම;

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම; සහ

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

බලධරයාගේ බලතල සහ කාර්ය.

5. 4 වන වගන්තියේ සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා බලධරයාට පහත දැක්වෙන බලතල සහ කාර්ය ඇත්තේ ය:—

(අ) රට තුළ විදුලි සංදේශ සේවාවන්, රටේ පවත්නා ආර්ථික හා සමාජ සංවර්ධනයට සහ අභිවෘද්ධියට මැනවින් හේතුවන පරිදි සහ දායක වන ආකාරයට ක්‍රියා කරවන බවට වගබලා ගැනීම;

(ආ) මේ පනත යටතේ විදුලි සංදේශ ක්‍රම ක්‍රියා කරවීම සඳහා බලපත්‍ර දීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ඇ) ගාස්තු ක්‍රම, මිල නියම කිරීම සහ සහනාධාර පිළිබඳ ප්‍රතිපත්ති ද, පොදු විදුලි සංදේශ සේවා සැපයීම සඳහා අවශ්‍ය නීතිමය පියවරවල් ද ඇතුළු විදුලි සංදේශ කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;



(ඈ) ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් පොදු යහපත සහ පොදු පසළුව සහ අදහස් උදහස් පිළිබඳව නිසි සැලකිල්ල යොමු කිරීම;

(ඉ) බලධරයාගේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලබන පොදු ප්‍රතිපත්තිමය විධානවලට අනුව ක්‍රියා කිරීම සහ 67 වන වගන්තියේ විධිවිධානවලට අනුව බලධරයාට අවශ්‍ය වන තොරතුරු සැපයීම;

(ඊ) ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ රටේ ආරක්ෂාව උදෙසා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කලින් කල බලධරයාට දෙනු ලබන පොදු හෝ විශේෂ විධාන අනුව ක්‍රියා කිරීම පිණිස නියමිත විධිමත් කිරීමේ පියවර ගැනීම;

(උ) උපකරණ හා තාක්ෂණික ප්‍රමිති සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ වෙනත් අදාළ ජාත්‍යන්තර සංවිධාන විසින් නියම කර ඇති නියමයන් අනුව ක්‍රියාකරුවකු කටයුතු කළ යුතු බවට විධාන කිරීම;

(ඌ) විදුලි සංදේශ කටයුතුවලට අදාළව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ඇති කර ගෙන ඇති ජාත්‍යන්තර සහ වෙනත් බැඳීම් ක්‍රියාකරුවන් විසින් පිළිපදිනු ලබන බවට වගබලා ගැනීම;

(එ) ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, විදුලි සංදේශ ක්‍රමයක් සඳහා ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන්, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, වෙනත් ජාත්‍යන්තර සංවිධාන සහ විදේශීය විදුලි සංදේශ ක්‍රියාකරුවන් සමග ගිවිසුම්වලට එළඹීම පිණිස, අදාළ අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සාකච්ඡාවල දී සහාය වීම;

(ඒ) විදුලි සංදේශ කටයුතු සම්බන්ධ ජාත්‍යන්තර සම්මේලනවල දී හෝ ජාත්‍යන්තර සහ විදේශීය සංවිධාන වෙනුවෙන් ආණ්ඩුව නියෝජනය කරන ලෙස නියම කරන ලද අවස්ථාවක හෝ අමාත්‍යවරයාගේ හෝ වෙනත් යම් අදාළ අමාත්‍යාංශයක ඉල්ලීම පිට, එසේ ආණ්ඩුව නියෝජනය කිරීම;

(ඔ) අමාත්‍යවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ගාස්තු ක්‍රම හෝ ගාස්තු ක්‍රම තීරණය කිරීමේ ක්‍රම රීති මගින් නිගමනය කිරීම;

එසේ වුවද, පැවරීමේ දිනයට පෙරාතුවම බලපැවැත්වූ ගාස්තු ක්‍රම, අනුප්‍රමාණ, ඇමතුම් ගාස්තු සහ වෙනත් ගාස්තු තවදුරටත් බලපවත්වනු ලබන අතර, මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රතිශෝධනය කරනු ලබන තෙක්, හෝ සංශෝධනය කරනු ලබන තෙක් මේ පනත යටතේ නිශ්චිතව නියම කරන ලද ගාස්තු ක්‍රම ලෙස සැලකිය යුතුය.

(ඕ) බලපත්‍රලාභී අන්තර් සම්බන්ධිත විදුලි සංදේශ ක්‍රමවල ක්‍රියාකරුවන්ට, ඒ විදුලි සංදේශ ක්‍රම අතර අන්තර් සම්බන්ධිත ගාස්තු සහ ඇමතුම් ගාස්තු සඳහා එකඟ වීමට හැකි විටක ඒ අන්තර් සම්බන්ධිත ගාස්තු සහ ඇමතුම් ගාස්තු අනුමත කිරීම සහ ක්‍රියාකරුවන්ට එසේ එකඟවීමට නොහැකි විටක ඒ ගාස්තු නිර්ණය කිරීම;

(ක) බලධරයා විසින් අනුමත කරනු ලබන ගිණුම් ක්‍රම පිළිගන්නා ලෙස විදුලි සංදේශ ක්‍රමවල ක්‍රියාකරුවන්ට නියම කිරීම;

(ග) සම්ප්‍රේෂණ සැලසුම්, සංඥාකරණ සැලසුම්, ස්විච්කරණ සහ අංක යොදන සැලසුම් තමා වෙත ඉදිරිපත් කරන ලෙස යම් ක්‍රියාකරුවකුට නියම කිරීම සහ ඒ සැලසුම් පළ කිරීම හා ඒවා අනුව කටයුතු කරන බවට වගබලා ගැනීම මෙන්ම, ඒ සැලසුම් අනුමත කිරීම හෝ මුළු වශයෙන් වෙනස් කිරීම;

(ච) විදුලි සංදේශ සේවා සම්පාදනය කිරීම සඳහා තාක්ෂණික ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි නිශ්චය කිරීම;

(ජ) විදුලි සංදේශ කටයුතුවලට සම්බන්ධ තාක්ෂණික මිනිස් බලකායට අධ්‍යාපනය සැලසීම සහ පුහුණුව සැලසීම සඳහා ක්‍රම නිශ්චය කිරීම;

(ට) විදුලි සංදේශ ක්‍රමවලට සම්බන්ධ කළ හැකි විදුලි සංදේශ උපකරණ වර්ග අනුමත කිරීම;

(ඩ) ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන සේවාවන් තත්ත්වය අධීක්ෂණය කිරීමට අවශ්‍ය යයි සලකනු ලබන විධාන නිකුත් කිරීම ඇතුළුව විධිමත් කිරීමේ පියවර ගැනීම සහ එම සේවාවන් මේ පනත යටතේ සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලබන සේවා තත්ත්වයන්ට අදාළ ප්‍රමිතිවලට අනුකූල වන බවට වග බලා ගැනීම;

(ණ) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල සහ පර්යේෂණ ආයතනවල විදුලි සංදේශ කටයුතු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය, ක්‍රියාකරුවන්ගේ සහයෝගය ඇතුව හෝ අන්‍යාකාරයකින් ප්‍රවර්ධනය කිරීම;

(ත) මේ පනත යටතේ තමාගේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධව කරුණු පිළිබඳ උපදෙස් ලබාගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි බලධරයා සලකන උපදේශක මණ්ඩල පිහිටුවීම;



(ද) ගුවන් විදුලි ධාරාවකට හෝ යම් සන්නිවේදන ක්‍රමයකට ඇති යම් බාධාවන් හෝ අවහිරයන් වළක්වා ගැනීම පිණිස හෝ එවැනි බාධාවන් හෝ අවහිරයන් ඉවත් කර ගැනීම පිණිස යම් රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් තැනැත්තකු හෝ සමග සාකච්ඡා කිරීම;

(න) ගුවන් විදුලි සංඛ්‍යාත පාවිච්චි කිරීම අවශ්‍ය වන ක්‍රියාකරුවන් සහ වෙනත් සංවිධාන සහ පුද්ගලයන් විසින් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි සංරක්ෂණය කරන බවට සහ නිසි පරිදි ප්‍රයෝජනය ගන්නා බවට වග බලා ගැනීම;

(ප) විදුලි උපකරණ මගින් සිදුවෙන විද්‍යුත් චුම්බක කැළඹීම් සහ සියලු අනවසර ගුවන් විදුලි සංඛ්‍යාත [illegible] කිරීම් අවම මට්ටමකට ගෙන ඒම සඳහා රීති සෑදීම සහ ඒවා පිළිපදින ලෙස බලකිරීම;

(බ) බලධරයාගේ අරමුණු ඉටුකර ගැනීමට ආනුෂංගික විය හැකි හෝ හිතකර විය හැකි හෝ මේ පනත යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ කාර්ය ඉටුකර ගැනීමට ආනුෂංගික විය හැකි හෝ හිතකර විය හැකි සියලු වෙනත් යම් ක්‍රියාවන් කිරීම.

[illegible]. (1) මේ පනත යටතේ බලධරයා සතු බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, ප්‍රමාණවත් සහ කාර්යක්ෂම විදුලි සංදේශ සේවාවන් සැපයීමේ කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන තාක්ෂණික ප්‍රමිති දැඩි කර ගැනීම සහ පවත්වා ගෙන යාම සඳහා බලධරයා විසින් නියමිත තාක්ෂණික පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි ය.

තාක්ෂණික ප්‍රමිති පවත්වා ගැනීම සඳහා බලධරයා විසින් පරීක්ෂණ පැවැත්වීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේලා, පරීක්ෂණ පැවැත්වීමේ කාර්යය සඳහා බලධරයා විසින් පරීක්ෂණ මණ්ඩල පත් කළ හැකි ය.

(3) පරීක්ෂණවලට ඉදිරිපත් වන අපේක්ෂකයන්ගෙන් නියමිත ගාස්තු අය කළ යුතු ය.

7. බලධරයා විසින්—

තොරතුරු ඉල්ලා සිටීමට සහ පරීක්ෂා කිරීමට බලධරයාට ඇති බලය.

(අ) ක්‍රියාකරුවකුගේ කටයුතුවල මූල්‍ය ශක්තිය සහ සත්‍ය තත්ත්වය දැන ගැනීමට බලධරයාට හැකි වන පිණිස ලිය විල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමේ සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත—

(i) පරීක්ෂා කර බැලීම සඳහා අවශ්‍ය යයි බලධරයා සලකන ඒ ක්‍රියාකරුගේ සියලු පොත් සහ ගිණුම්; සහ

(ii) ඉහත කී කාර්යය සඳහා බලධරයා විසින් නියම කරනු ලබන තාක්ෂණික, මූල්‍ය හෝ වෙනත් සියලු තොරතුරු

තමා වෙත සපයන ලෙස ඒ ක්‍රියාකරුට නියම කළ හැකි ය :

එසේ වුව ද, එවැනි යම් නියම කිරීමක් අනුව ක්‍රියා කරමින් ක්‍රියාකරු විසින් තමා වෙත සපයන ලද සියලු තොරතුරු රහස්‍ය තොරතුරු ලෙස බලධරයා විසින් සැලකිය යුතු ය.

(ආ) මේ පනත යටතේ හෝ බලපත්‍ර කොන්දේසි හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුට—

(i) ඒ තැනැත්තා සන්තකයේ හෝ ඔහුගේ පාලනය සඳහන් කර ඇති හෝ විස්තර කර ඇති සහ ඒ තැනැත්තාගේ භාරයේ හෝ පාලනය යටතේ ඇති යම් ලේඛනයක්, ඒ දැන්වීමේ සඳහන් කාලය ඇතුළත සහ ස්ථානයක දී තමා වෙත ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකි ය;

(ii) ඒ තැනැත්තා සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති යම් තොරතුරක්, වාර්තාවක්, ගිණුමක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කළ හැකි ය.

එසේ වුව ද, යම් අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන සිවිල් නඩු කටයුත්තක දී ඉදිරිපත් කරන ලෙස මේ ඡේදයේ සඳහන් තැනැත්තකුට බල කරනු ලැබිය නොහැකි යම් ලේඛනයක්, එවැනි යම් කාර්යයක් සඳහා ඉදිරිපත් කරන ලෙස ඔහුට බල කරනු නොලැබිය යුතු ය.

ක්‍රියාකරුගේ වාර්ෂික වාර්තාව සහ විගණනය කළ ගිණුම් ප්‍රකාශය.

8. සෑම ක්‍රියාකරුවකු ම තම මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, ඒ මුදල් වර්ෂය ඇතුළත තම කටයුතු පිළිබඳව සහ තම ආදායම සහ වියදම පිළිබඳව සත්‍ය සහ සාධාරණ විස්තරයක් දැක්වෙන වාර්තාවක්, ඒ වර්ෂය සඳහා විගණනය කළ ගිණුම් ප්‍රකාශයක් ද සමඟ පිළියෙල කොට, ඒ වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

බලධරයා විසින් පැමිණිලි විභාග කළ යුතු බව.

9. (1) ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවය පිළිබඳව විදුලි සංදේශ සේවයේ දායකයකු හෝ මහජනයා අතුරෙන් කෙනකු හෝ විසින් බලධරයා වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට, අවශ්‍ය යයි බලධරයා සලකන විමර්ශනයක් බලධරයා විසින් පැවැත්විය හැකි අතර කාරණයට අදාළ අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද බලධරයා විසින් සැලැස්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් විමර්ශනයක් පැවැත්වීමේ දී, ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍ය යයි බලධරයාට පෙනී යන පියවර ගන්නා ලෙස බලධරයා විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථාවලදී මුදල් සහන සලසන ලෙස ද විධාන කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම පැමිණිල්ලක් ම ලියවිල්ලකින් කළ යුතු අතර ඒ පැමිණිල්ලට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතු ය.



බලධරයා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කරන එකම අධිකාරය වන බව.

10. (1) ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම කළමනාකරණය කළ හැකි සහ පාලනය කළ හැකි සහ ආනුෂංගික සහ සීමිත විමෝචනය සහ භූස්ථානගත චන්ද්‍රිකා කක්ෂයට අදාළ කරුණු කළමනාකරණය කළ හැකි සහ පාලනය කළ හැකි ශ්‍රී ලංකාව ඇතුළත එකම නීත්‍යනුකූල ආයතනය බලධරයා වන අතර එය භාවිතා කිරීමේ අවසරය ආපසු ගැනීම හෝ අත් හිටුවීම හෝ එවැනි යම් විමෝචන නතර කිරීම අවශ්‍යයයි බලධරයා සලකන අවස්ථාවක එසේ කිරීමට ද බලධරයාට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් අන්තර්ජාතික විදුලි සංදේශ සංගමය සමග හෝ ඊට සම්බන්ධ ආයතන සමග සාකච්ඡා කොට ක්‍රියා කළ හැකි එකම නීත්‍යනුකූල අධිකාරය බලධරයා වන්නේ ය.

බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.

11. (1) විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියා කරවීමට 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් මගින් බලය දෙනු ලැබූ තැනැත්තකු තමාගේ බලපත්‍රයේ සඳහන් කොන්දේසි අතුරින් යම් කොන්දේසියක් උල්ලංඝනය කරන බවට හෝ උල්ලංඝනය කර ඇති බවට බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ කොන්දේසියට අනුව ක්‍රියා කරන බවට වගබලා ගැනීමේ කාර්යය සඳහා බලධරයා විසින් (2) වන උපවගන්තියට යටත්ව නියමයක් කිරීම හෝ (3) වන උපවගන්තියට යටත්ව එවැනි යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, බලධරයා විසින්—

(අ) නියමය කිරීමට තමා අදහස් කරන බව සඳහන් කරමින් සහ එහි ප්‍රතිඵලය සඳහන් කරමින්;

(ආ) බලපත්‍රයේ අදාළ කොන්දේසිය සඳහන් කරමින් සහ තම මතය අනුව ඒ කොන්දේසිය උල්ලංඝනය කිරීම සංයුක්ත වන හෝ සංයුක්ත වීමට ඉඩ ඇති ක්‍රියා හෝ අකෘතයන් සඳහන් කරමින්; සහ

(ඇ) යෝජිත නියමය, සම්බන්ධයෙන් කරුණු සැලකිරීම් ඉදිරිපත් කිරීමට හෝ විරෝධතා ඉදිරිපත් කිරීමට ඉඩ ඇති (දැන්වීම පළ කිරීමේ දින සිට දින විසි අටකට අඩු නොවන) කාලය සඳහන් කරමින්

දැන්වීමක් කළ යුතු අතර යථා පරිදි ඉදිරිපත් කරන ලද සහ ඉල්ලා අස් කර ගනු නොලැබූ කරුණු සැලකිරීම් හෝ විරෝධතා සලකා බැලිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙර, බලධරයා විසින්—

(අ) ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට තමා අදහස් කරන බව සඳහන් කරමින් සහ එහි ප්‍රතිඵලය සඳහන් කරමින්;

(ආ) යෝජිත ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින්, ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ගැන කරුණු සැලකිරීම් ඉදිරිපත් කිරීමට හෝ විරෝධතා ඉදිරිපත් කිරීමට ඉඩ ඇති (දැන්වීම පළ කිරීමේ දින සිට දින විසි අටකට අඩු නොවන) කාලය සඳහන් කරමින්

දැන්වීමක් කළ යුතු අතර, යථා පරිදි ඉදිරිපත් කරන ලද සහ ඉල්ලා අස් කර ගනු නොලැබූ කරුණු සැලකිරීම් හෝ විරෝධතා සලකා බැලිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් අදාළ වන කරුණු ඒ දැන්වීම නිසා බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීමේ කාර්යය සඳහා උචිත වන්නේ යයි බලධරයා සලකන ආකාරයකින් පළකිරීමෙන් සහ ඒ දැන්වීමේ පිටපතක් ඒ දැන්වීම නිසා බලපෑමක් ඇති වූ ක්‍රියාකරු වෙත යැවීමෙන්, ඒ දැන්වීම කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් බලධරයා විසින්—

(අ) ඒ නියමය නිසා බලපෑමක් ඇති වීමට ඉඩ ඇති තැනැත්තන්ගේ අවධානයට ඒ නියමය යොමු කිරීමේ කාර්යය සඳහා උචිත වන්නේ යයි බලධරයා සලකන ආකාරයකින් ඒ නියමය පළ කළ යුතු ය; තවද,

(ආ) ඒ නියමය නිසා බලපෑමක් ඇති වූ ක්‍රියාකරු වෙත ඒ නියමයේ පිටපතක් භාර දිය යුතු ය.

ප්‍රසිද්ධ විභාග සහ කාර්ය පරිපාටි.

12. (1) බලධරයා වෙත ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීම් අනුව හෝ නොඑසේව, බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමට හෝ යෝජිත ක්‍රියාත්මක කිරීමට අදාළ යම් කරුණක් පිළිබඳව විමර්ශනයක් පැවැත්වීම හෝ තීරණය කිරීම පොදු යහපත පිණිස අවශ්‍ය බව බලධරයා සලකන අවස්ථාවක, බලධරයා විසින් සිය අභිමතයෙහි මෙන්ම ප්‍රසිද්ධ විභාගයක් පැවැත්විය හැකි ය.

(2) විදුලි සංදේශ කටයුතුවලට සම්බන්ධ යම් කාරණයකට හෝ දේකට අදාළව ප්‍රසිද්ධ විභාගයක් පවත්වන ලෙස පොදු යහපත උදෙසා අමාත්‍යවරයා විසින් විධානයක් කරනු ලැබූ අවස්ථාවක ඒ විධානයේ සඳහන් ඒ කාරණය හෝ දේ සම්බන්ධයෙන් බලධරයා විසින් ප්‍රසිද්ධ විභාගයක් පැවැත්විය යුතු ය.

(3) (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමේ කාර්ය සඳහා බලධරයාගෙන් හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් යම් නිලධරයකුගෙන් සහ තවත් කාර්ය සඳහා බලධරයා විසින් නම් කරනු ලබන නිලධරයන් දෙදෙනකුගෙන් හෝ වැඩි දෙනකුගෙන් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණ කමිටුවක් තිබිය යුතු ය. මෙම කමිටුවේ යම් රැස්වීමක දී බලධරයා හෝ ඔහු විසින් නම් කරන ලද මුලින් සඳහන් නිලධරයා මූලාසන දැරිය යුතු ය.



(4) මේ වගන්තිය යටතේ කමිටුව විසින් පවත්වනු ලබන ප්‍රසිද්ධ විභාගයක කටයුතු, විමර්ශනයට භාජනව ඇති කාරණාවට අදාළ තොරතුරු අනාවරණය කර ගැනීමට වඩාත්ම උචිත බවට කමිටුවට පෙනී යන්නාවූ ද ස්වාභාවික යුක්ති මූලධර්මවලට අනනුකූල නොවන්නාවූ ද යම් ආකාරයකින්, පවත්වනු ලැබිය හැකි ය.

(5) සාක්ෂි හෝ තර්ක ලියවිලි මගින් ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් නියම කළ හැකි අතර වාචික සාක්ෂිවලට හෝ තර්කවලට ඇහුම්කන් දිය යුත්තේ කවර කාරණා සම්බන්ධයෙන් ද යන්න වග ද කමිටුව විසින් තීරණ කළ හැකි ය.

(6) ඉදිරිපත් කරන ලද වාචික හෝ ලේඛනමය සාක්ෂි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම කමිටුව විසින් කළ හැකි අතර සාක්ෂි පිළිගැනීම පිළිබඳ සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(7) අධිකරණයක් හමුවේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට, ඒ අධිකරණය හමුවේ ඔහු විසින් දෙන ලද සාක්ෂි සම්බන්ධයෙන් හිමිවන වරප්‍රසාදම කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන සෑම තැනැත්තකුටම ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමි වන්නේ ය.

(8) ප්‍රසිද්ධ විභාගයක කටයුතු මහජනයාට විවෘතව තිබිය යුතු අතර එහිදී දෙන ලද සාක්ෂිවල සම්පිණ්ඩනයක් සහ සැලකිල්ලට ගන්නා ලද සියලු සිද්ධි පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් කොට ඒ විභාගය පිළිබඳ වාර්තාවක් ඒ විභාගයේ මූලාසනය දරන සාමාජිකයා විසින් තබා ගත යුතු ය.

(9) මේ වගන්තිය යටතේ ප්‍රසිද්ධ විභාගයකදී විෂය වස්තුව වන යම් කාරණයකින් තමාගේ සම්බන්ධතාවනට යම් බලපෑමක් ඇති කිරීම සඳහා සාධාරණව අවශ්‍ය වන කාලසීමා කමිටුව විසින් තීරණය කළ යුතු අතර එසේ තීරණය කරන ලද ඒ ඒ කාලසීමා ඇතුළත ඒ කාරණා ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් නියම කළ හැකි ය.

(10) කමිටුව ඉදිරියට කැඳවනු ලැබූ හෝ කමිටුව ඉදිරියේ ඇති යම් කාරණයකින් තමාගේ සම්බන්ධතාවනට යම් බලපෑමක් ඇති වීමට ඉඩ ඇති යම් තැනැත්තකුට පෞද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකු මගින් හෝ පෙනී සිටිය හැකි ය.

(11) කමිටුවේ සාමාජිකයින් අතර මතභේදයක් ඇති වූ විටක, කමිටුවේ බහුතර සාමාජික සංඛ්‍යාවගේ තීරණය කමිටුවේ තීරණය වන්නේ ය.

(12) ප්‍රසිද්ධ විභාගයක් පවත්වනු ලබන අතරතුර හෝ ප්‍රසිද්ධ විභාගයක් අවසානයේ දී, කමිටුව විසින්—

(අ) තමන් හමුවේ ඇති කාරණයට අදාළව හෝ ඉන් නොවිසඳුම අදාළව නියමයක් හෝ ප්‍රදානයක් කළ හැකි අතර ඊට හේතු ද දැක්විය යුතු ය. නැතහොත් හේතු දක්වමින් විධානයක් කළ හැකි ය;

(ආ) යම් කාරණයක් හෝ එහි කොටසක් ඉතා නොවැදගත් බව හෝ පීඩාකාරී බව හෝ වැඩිදුරටත් කටයුතු කරගෙන යාම පොදු යහපත පිණිස අවශ්‍ය නොවන බව හෝ යෝග්‍ය නොවන බව පෙනී ගියහොත්, එම කාරණය හෝ කොටස නිෂ්ප්‍රභා කිරීම හෝ එම කාරණය හෝ කොටස ගැන වැඩිදුර විභාග නොකිරීම හෝ තීරණයක් නොකිරීම කළ හැකි ය;

(ඇ) තමන් හමුවේ ඇති යම් කාරණයක් අප්‍රමාදව සහ යුක්ති සහගතව විභාග කොට තීරණයක් දීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු විධාන දීම සහ සියලු දේවල් කිරීම කළ හැකි ය.

(13) (12) වන උපවගන්තියේ (අ) ඡේදය අනුව කරන ලද සෑම නියමයක්ම හෝ ප්‍රදානයක්ම සහ දෙන ලද සෑම විධානයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ සෑම නියමයකම, ප්‍රදානයකම හෝ විධානයකම පිටපත් ප්‍රසිද්ධ විභාගයේ එක් එක් පාර්ශ්වකරු වෙත භාරදිය යුතු ය.

සාක්ෂි දීම සඳහා තැනැත්තන් කැඳවීමට ඇති බලය.

13. (1) 12 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ විභාගයකට පැමිණ සිටින ලෙස, කමිටුව ඉදිරියේ ඇති යම් කාරණයකට අදාළව සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීමට කමිටුවේ මතය අනුව හැකි යම් තැනැත්තකු කැඳවීමට කමිටුවට බලය තිබෙන අතර දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට හෝ, ඔහුගෙන් ප්‍රශ්න කිරීම ද කළ හැකි ය. එසේ පැමිණෙන තැනැත්තකුට එසේ පැමිණීම සඳහා ඔහු විසින් අවශ්‍යයෙන්ම දරන ලද සාධාරණ වියදම් ගෙවිය හැකි ය.

(2) කමිටුව ඉදිරියේ පෙනී සිටින ලෙස කැඳවනු ලබන යම් තැනැත්තකු විසින්—

(අ) කැඳවීම් නියෝගයේ සඳහන් වේලාවේ දී සහ ස්ථානයට පැමිණීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ආ) දිවුරීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ විධිමත් ලෙස දිවුරීමෙන් පසු, කමිටුව විසින් ඔහුගෙන් අසන ලද යම් ප්‍රශ්නයකට සාධාරණ හේතුවක් නොමැතිව පිළිතුරු දීම පැහැර හරිනු ලැබුවහොත් හෝ එවැනි යම් ප්‍රශ්නයකට සිතාමතා අසත්‍ය පිළිතුරක් දෙනු ලැබුවහොත්; හෝ

(ඇ) තම සන්තකයේ ඇති සහ ඉදිරිපත් කරන ලෙස තමාට නියම කරනු ලැබූ යම් ලේඛනයක් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්

ඒ තැනැත්තා කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ අගෞරව වන පරිදි අපහාස කිරීමේ වරද කරන්නේ ය.



(3) යම් තැනැත්තකු කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ අගෞරව වන ආකාරයෙන් (2) වන උපවගන්තියේ සඳහන් වන පරිදි අපහාස කිරීමේ වරදක් කර ඇති බව කමිටුව විසින් තීරණය කරන ලද අවස්ථාවක කමිටුවේ තීරණය දැක්වෙන සහතිකයක් ප්‍රසිද්ධ විභාගයේ දී සභාපතිත්වය දැරූ සාමාජිකයා විසින් අභියාචනාධිකරණය වෙත යවන ලෙස කමිටුව විසින් සැලැස්විය හැකි ය. එවැනි සෑම සහතිකයක්ම ප්‍රසිද්ධ විභාගයේ දී සභාපතිත්වය දැරූ සාමාජිකයා විසින් අත්සන් කළ යුතු ය.

(4) සැලකිල්ලට භාජනය කිරීම පිණිස යයි අභියාචනාධිකරණය අදහස් කරන අපහාස කිරීමේ වරදකට දඬුවම් පැමිණවීම සඳහා පවත්වනු ලබන යම් නඩු කටයුත්තක දී, (3) වන උපවගන්තිය යටතේ අත්සන් කරනු ලැබ එම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සහතිකයක් ලෙස සැලකෙන යම් ලේඛනයක්—

(අ) සාක්ෂියක් ලෙස භාර ගත යුතු අතර පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් හැර, තවදුරටත් ඔප්පු කිරීමකින් තොරව එවැනි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) තවද, සහතිකයේ දක්වා ඇති තීරණය කමිටුව විසින් කරන ලද තීරණයක් බවට සහ ඒ තීරණයේ සඳහන් සිද්ධි පිළිබඳ මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(5) 12 වන වගන්තිය යටතේ පවත්වනු ලබන යම් ප්‍රසිද්ධ විභාගයක දී කමිටුවේ අධිකාරයට විරුද්ධව හෝ අගෞරව වන ආකාරයෙන් කරන ලද සෑම අපහාස කිරීමේ වරදක්ම සම්බන්ධයෙන්, ඒ වරද ඒ අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ අගෞරව වන ආකාරයෙන් කරන ලද අපහාස කිරීමේ වරදක් වූ විටක දඬුවම් කරන ආකාරයෙන්ම, අභියාචනාධිකරණය විසින් හෝ එහි යම් විනිශ්චයකාරවරයකු විසින් හෝ දඬුවම් කළ හැකි ය.

11 වන සහ 12 වන වගන්ති යටතේ කරනු ලබන නියමයක්, නීති ප්‍රශ්නයක් මත අභියාචනයකට යටත්ව අවසානාත්මක වන බව.

14. (1) 11 වන වගන්තිය යටතේ බලධරයා විසින් කරන ලද නියමයක් සහ 12 වන වගන්තිය යටතේ කමිටුව විසින් කරන ලද නියමයක් හෝ ප්‍රදානයක් හෝ දෙන ලද විධානයක් (2) වන උපවගන්තියට යටත්ව අවසානාත්මක වන්නේ ය.

(2) 11 වන වගන්තිය හෝ 12 වන වගන්තිය යටතේ කරන ලද නියමයකින් හෝ ප්‍රදානයකින් දෙන ලද විධානයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් ලිඛිත පෙත්සමක් මගින් කළ යුතු අතර—

(අ) එය, ඒ නියමය, ප්‍රදානය හෝ විධානය අභියාචක වෙත දැනුම් දෙනු ලැබූයේ යම් ලිපියකින් ද, ඒ ලිපියේ දින සිට දින තිහක් ඇතුළත බලධරයා වෙත මුල් පිටපත සහ පිටපත් දෙකක් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, බලධරයාගේ හෝ කමිටුවේ නියමය, ප්‍රදානය හෝ විධානය සහ තර්ක කිරීමට බලාපොරොත්තු වන නීති ප්‍රශ්නය එහි සඳහන් කළ යුතු ය;

(ඇ) අවශ්‍ය පාර්ශ්වකරුවකු ඒ අභියාචනයේ වගඋත්තරකරුවකු ලෙස එහි සඳහන් කළ යුතු ය; සහ

(ඈ) රුපියල් එක් දහසක ගාස්තුවක් ඒ සමග ඉදිරිපත් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් ආකාරයෙන් සහ කාලය ඇතුළත බලධරයා වෙත අභියාචන පෙත්සමක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක, ඔහු විසින්—

(අ) පෙත්සමේ පිටපතක්, ඒ පෙත්සමේ සඳහන් නියමය, ප්‍රදානය හෝ විධානය කරනු ලැබූවේ යම් කරුණු මත දී ද ඒ කරුණු පිළිබඳ වාර්තාවක් ද සමග අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය. නැතහොත් යැවීමට සැලැස්විය යුතු ය.

(ආ) අභියාචන පෙත්සමේ නම් කර ඇති වගඋත්තරකරුට ඒ අභියාචනය පිළිබඳ දැන්වීමක් ඒ පෙත්සමේ පිටපතක් ද සමග නිකුත් කළ යුතු ය. නැතහොත් නිකුත් කිරීමට සැලැස්විය යුතු ය.

(ඇ) ඒ පෙත්සමේ පිටපතක් ගොනුගත කළ යුතු ය. නැතහොත් ගොනුගත කිරීමට සැලැස්විය යුතු ය.

(5) අභියාචනාධිකරණය විසින් ඒ නීති ප්‍රශ්නය නිරණය කිරීමේලා, අවස්ථාවෝචිත පරිදි, බලධරයාගේ හෝ කමිටුවේ නියමය, ප්‍රදානය හෝ විධානය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒ නීති ප්‍රශ්නය පිළිබඳ ඒ අධිකරණයේ තීරණය ද සමග එම කාරණය සුදුසු යයි සලකනු ලබන විධාන ද සමග අවස්ථාවෝචිත පරිදි, බලධරයා වෙත හෝ කමිටුව වෙත ආපසු යැවීම කළ හැකි ය.

ලේඛන සාක්ෂි.

15. බලධරයා විසින් කරන ලද රීතියක, නියමයක, ප්‍රදානයක හෝ විධානයක හෝ බලධරයාගේ භාරයේ ඇති යම් ලේඛනයක හෝ සත්‍ය පිටපතක් ලෙස ඔහු විසින් සහතික කරන ලද පිටපතක් හෝ කමිටුව විසින් කරන ලද නියමයක, ප්‍රදානයක හෝ විධානයක සත්‍ය පිටපතක් ලෙස ඒ කමිටුවේ සභාපතිත්වය දරන සාමාජිකයා විසින් සහතික කරන ලද පිටපතක් යම් අධිකරණයක දී, අවස්ථාවෝචිත පරිදි, බලධරයාගේ හෝ ඒ සාමාජිකයාගේ අත්සන ඔප්පු කිරීමකින් තොරව, ඒ රීතිය, නියමය, ප්‍රදානය, විධානය හෝ ලේඛනය පිළිබඳ සාක්ෂියක් වන්නේ ය.



11 වන වගන්තිය හෝ 12 වන වගන්තිය යටතේ කරන ලද හෝ දෙන ලද නියමයක්, ප්‍රදානයක් හෝ විධානයක් උල්ලංඝනය කිරීම.

16. 11 වන වගන්තිය යටතේ බලධරයා විසින් කරන ලද නියමයක් හෝ 12 වන වගන්තිය යටතේ කමිටුව විසින් කරන ලද හෝ දෙන ලද නියමයක්, ප්‍රදානයක් හෝ විධානයක් නීත්‍යනුකූල බලයක් නොමැතිව උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම නීත්‍යනුකූල බලයක් නොමැතිව පැහැර හරින හෝ යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට ද වරදකරු කිරීමෙන් පසුව වරද දිගටම කර ගෙන යන අවස්ථාවක, එසේ වරද දිගටම කරගෙන යන සෑම දවසක් ම සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන අතිරේක දඩයකට ද ඔහු යටත් වන්නේ ය.

## II වන කොටස
## බලපත්‍ර දීම

බලපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතු බව.

17. (1) අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තියට අනුකූලව දෙන ලද බලපත්‍රයක් යටතේ හැර, 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, බලධරයාගේ නිර්දේශය මත, (1) වන උපවගන්තිය යටතේ සඳහන් බලපත්‍රය දිය හැකිය. එසේ වුවත්, සඳහන් කළ යුතු හේතු මත, එවැනි නිර්දේශයක් ප්‍රතික්ෂේප කර තමාගේම අභිමතය මත බලපත්‍රයක් දීමට ඔහුට බලය ඇත්තේ ය.

(3) (අ) බලපත්‍රයක් දෙන ලෙස අමාත්‍යවරයාට නිර්දේශ කිරීමට බලධරයා අදහස් කරන බවට ප්‍රසිද්ධ දැන්වීමක් කිරීම පොදු යහපත සඳහා හේතු වේ යයි බලධරයා සලකන අවස්ථාවක බලධරයා විසින් සුදුසු යයි තමා සලකන ක්‍රමයකින් ඒ සම්බන්ධයෙන් එසේ ප්‍රසිද්ධ දැන්වීමක් කළ හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් දැන්වීමේ—

(i) යම් නිශ්චිත තැනැත්තකුට බලපත්‍රයක් දීම සඳහා නිර්දේශ කිරීමට තමා අදහස් කරන බව සඳහන් විය යුතු ය.

(ii) යෝජිත බලපත්‍රය දීම සම්බන්ධයෙන් කරුණු සැලකිරීම් හෝ විරෝධතා හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි (දැන්වීම පළ කිරීමේ දින සිට දින තිස් අටකට නොඅඩු විය යුතු) කාලය සඳහන් විය යුතු ය.

(ඇ) එවැනි දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් යථා පරිදි ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක් හෝ විරෝධතාවක් බලධරයා විසින් සලකා බැලිය යුතු ය.

(4) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම බලධරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට යම් ලියවිල්ලකින් කළ යුතු අතර, එය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) බලධරයා විසින් බලපත්‍රයක් දීම සඳහා නිර්දේශ කරනු ලැබීමට පෙර, බලපත්‍රයක් ඉල්ලුම් කරනු ලැබූ විදුලි සන්දේශ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම්කරුට හැකියාව ඇති බවට බලධරයා සෑහීමට පත් විය යුතු ය.

(6) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ නම්,—

(අ) ඒ බලපත්‍රය ඉල්ලුම්කරු විසින් බලපත්‍ර ගාස්තුව ගෙවනු ලැබූ විට නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ බලපත්‍රය ලියවිල්ලකින් විය යුතු අතර ඒ බලපත්‍රයේ තත් කාර්ය සඳහා අඩංගු යම් නියමයක් අනුව, එය කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් හැර, එහි සඳහන් කාලසීමාව තුළ එය බලාත්මකව පැවතිය යුතු ය.

(ඇ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියමයන් සහ කොන්දේසි ඒ බලපත්‍රයේ සඳහන් විය යුතු ය.

(ඈ) ඒ බලපත්‍රයේ සඳහන් විදුලි සංදේශ සේවා, ඒ විදුලි සංදේශ ක්‍රමය මගින් සපයන ලෙස ඒ බලපත්‍රයෙන් නියම කළ යුතු ය.

(ඉ) ඒ බලපත්‍රය අදාළ වන යම් විදුලි සංදේශ ක්‍රමයකට—

(i) බලපත්‍රයේ සඳහන් වෙනත් යම් විදුලි සංදේශ ක්‍රමයක් ; සහ

(ii) බලපත්‍රයේ සඳහන් යම් උපකරණයක් සම්බන්ධ කිරීමට ඒ බලපත්‍රයෙන් අවසර දෙනු ලැබිය හැකි ය.

(ඊ) තවද, ඒ බලපත්‍රය අදාළ වන යම් විදුලි සංදේශ ක්‍රමයක් මාර්ගයෙන් බලපත්‍රයේ සඳහන් යම් විදුලි සංදේශ සේවා සපයන ලෙස ඒ බලපත්‍රයෙන් අවසර දෙනු ලැබිය හැකි ය.

(7) (6) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් කර ඇති නියමයන්ට සහ කොන්දේසිවලට—

(අ) 4 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගත් විට, අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන (බලපත්‍රය අදාළ වන විදුලි සංදේශ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන හෝ නොවන) කොන්දේසි ;

(ආ) බලපත්‍රය දීමේ දී හෝ බලපත්‍රය වලංගුව පවතින අතරතුර, හෝ බලපත්‍රය දීමේ දී සහ බලපත්‍රය වලංගුව පවතින අතරතුර බලධරයා විසින් දරනු ලබන වියදම් ගෙවීම පිණිස බලධරයා විසින් නිර්ණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ බලධරයා වෙත ගෙවන ලෙස සහ නියමිත කාර්යයන් සඳහා බලධරයා විසින් භාවිත කරනු ලැබීම පිණිස ක්‍රියාකරුගේ වාර්ෂික පිරිවැටුම මතවූ අනුප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලබන වාර්ෂික සෙස් බද්දක් බලධරයා වෙත ගෙවන ලෙස නියම කරන කොන්දේසි;

(ඇ) මේ පනත යටතේ බලධරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා බලධරයාට අවශ්‍ය වන ලේඛන, ගිණුම්, ඇස්තමේන්තු, වාර්තා හෝ වෙනත් තොරතුරු බලධරයා විසින් සාධාරණ



ලෙස නියම කරනු ලබන ආකාරයකට සහ එසේ නියම කරන ලද වේලාවල්වල දී බලධරයා වෙත ඉදිරිපත් කරන ලෙස ක්‍රියාකරුවකුට නියම කරන කොන්දේසි;

(ඈ) සපයනු ලබන යම් සේවාවක්, කරනු ලබන යම් සම්බන්ධ කිරීමක් හෝ දෙනු ලබන අවසරයක් සම්බන්ධයෙන් යම් නිශ්චිත තැනැත්තකුට හෝ යම් පන්තියකට හෝ විස්තරයකට අයත් වන තැනැත්තන්ට අයුතු ප්‍රමුඛතාවක් දැක්වීමෙන් හෝ ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අයුතු විෂමතාවක් කිරීමෙන් හෝ වැළකෙන ලෙසට ක්‍රියාකරුවකුට තහනම් කෙරෙන කොන්දේසි;

(ඉ) සපයනු ලබන සේවාවලට, කරනු ලබන සම්බන්ධ කිරීමට හෝ දෙනු ලබන අවසරයට අදාළ ගාස්තු සහ වෙනත් නියමයන් හා කොන්දේසි දැක්වෙන දැන්වීමක් බලපත්‍රයේ සඳහන් කරනු ලබන ආකාරයකට සහ එසේ සඳහන් කරනු ලබන වේලාවන්වල දී පළ කරන ලෙස ක්‍රියාකරුට නියම කරන කොන්දේසි;

(ඊ) බිල්පත් තොරතුරු, ගාස්තු ක්‍රම පිළිබඳ තොරතුරු, නාමාවලි සේවාවන් සහ නාමාවලි විමසුම් සේවාවන් ඇතුළත් වන ප්‍රමාණවත් සහ සතුටුදායක තොරතුරු සැපයීමේ ක්‍රමයක් භාවිත කරන්නන්ට සපයනු ලබන බවට සහතික වන ලෙස ක්‍රියාකරුවකුට නියම කරන කොන්දේසි;

(උ) (i) ක්‍රියාකරුවකු විසින් තමාගේ විදුලි සංදේශ පද්ධතිය සැලසුම් කිරීමේ දී සහ පවත්වාගෙන යාමේ දී අනුකූල විය යුතු ජාතික සම්ප්‍රේෂණ සැලැස්ම, සංඥාකරණ සැලැස්ම, ස්විච්කරණ සැලැස්ම, අංක යොදන සැලැස්ම සහ අය කිරීමේ සැලැස්ම සම්බන්ධයෙන් බලධරයා විසින් දෙනු ලබන විධානවලට සහ ඉහත කී සැලසුම්වලට වෙනස්වන ආකාරයකට කටයුතු කිරීමට සිදුවුවහොත් බලධරයාගේ අනුමතය ලැබිය යුතු කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන ලෙස;

(ii) ජාතික සහ අන්තර්ජාතික පණිවුඩ ක්‍රමයේ මාර්ග සකස් කිරීමේ දී ක්‍රියාකරුවකු විසින් අනුගමනය කරන ක්‍රම පිළිබඳව බලධරයාට දැනුම් දෙන ලෙස; සහ

(iii) භූගත කේබල් හෝ කුළුණු රැහැන් ඇඳීම නිසා පාඩු සිදුවන තැනැත්තන්ට වන්දි ගෙවන බවට සහතික වන ලෙස

ඒ ක්‍රියාකරුවකුට නියම කරන කොන්දේසි;

(ඌ) (i) බලපත්‍රයේ සඳහන් කරනු ලබන කාරණා සම්බන්ධයෙන් බලධරයා විසින් කරනු ලබන යම් විධානයකට අනුකූලව කටයුතු කරන ලෙස;

(ii) කරන ලෙස හෝ නොකරන ලෙස බලපත්‍රයේ සඳහන් ඉද් බලධරයාගේ කැමැත්ත ඇතිව කරන ලෙස හෝ බලධරයාගේ කැමැත්ත ඇතිව මිස නොකරන ලෙස;

(iii) බලපත්‍රයේ සඳහන් වන්නා වූ ද බලපත්‍රය යටතේ පැන නඟින්නා වූ ද ප්‍රශ්න තීරණය කිරීම සඳහා බලධරයා වෙත යොමු කරන ලෙස

ක්‍රියාකරුවකුට නියම කරනු කොන්දේසි;

(එ) බලපත්‍රයේ සඳහන් වන වෙනත් විදුලි සංදේශ ක්‍රම සහ උපකරණ, බලපත්‍රය අදාළ වන යම් විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ කිරීමට නියම කරන හෝ එවැනි යම් ක්‍රමයකට සම්බන්ධ කිරීමට අවසර දෙන කොන්දේසි;

(ඒ) හදිසි අවස්ථාවලදී සේවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ සැලැස්මක් සකස් කර පළ කරන ලෙස ක්‍රියාකරුවකුට නියම කරන කොන්දේසි;

(ඔ) ක්‍රියාකරුවකු විසින් යෝජනා කරනු ලබන ගාස්තු ක්‍රම ගැලපුම් බලධරයා විසින් අනුමත කරනු ලබන්නේ යම් පිළිගත හැකි ආර්ථික මිණුම් දඬු අනුව ද, ඒ මිණුම් දඬු සඳහන් කරන කොන්දේසි

ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයකට ප්‍රසිද්ධිය දීම සඳහා වඩාත්ම උචිත යයි බලධරයා තීරණය කරනු ලබන ආකාරයකින් බලපත්‍රය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(9) බලපත්‍රයක් දීම සඳහා ගාස්තු වශයෙන් මේ වගන්තිය යටතේ ගෙවනු ලබන සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

17 වන වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක් මද වශයෙන් වෙනස් කිරීම.

18. (1) 17 වන වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක අඩංගු යම් කොන්දේසියක් මද වශයෙන් වෙනස් කරන ලෙස බලධරයා විසින් අමාත්‍යවරයාට, ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, නිර්දේශ කළ හැකි අතර, අමාත්‍යවරයාගේ එකඟත්වය ලැබුණු පසු, ඒ මද වශයෙන් වෙනස් කිරීම යථා පරිදි කළ හැකි ය.

(2) බලපත්‍රයක අඩංගු යම් කොන්දේසියක් මද වශයෙන් වෙනස් කරන ලෙස (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට පළමුව ඒ පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමක් කිරීම පොදු යහපත පිණිස වේ යයි බලධරයා අදහස් කරන්නේ නම්, ඔහු විසින්, 17 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් ආකාරයට එසේ ප්‍රසිද්ධ දැන්වීමක් කළ හැකි ය.



(3) ඒ ප්‍රසිද්ධ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් යථා පරිදි ඉදිරිපත් කරනු ලබන යම් කරුණු සැලකිරීමක් හෝ විරෝධතාවක් බලධරයා විසින් සලකා බැලිය යුතු ය.

බලපත්‍රයක් නොමැතිව විදුලි සංදේශ ක්‍රමයක් පවත්වා ගෙන යාම වරදක් වන බව.

19. (1) 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා නොගෙන ශ්‍රී ලංකාව ඇතුළත විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කරන තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) ක්‍රියාකරුවකු පහත දැක්වෙන අවස්ථාවල දී මේ පනත යටතේ වරදක් කරන්නේ ය:—

(අ) බලපත්‍රය දෙනු ලැබුවේ යම් විදුලි සංදේශ ක්‍රමයක් සඳහා ද ඒ විදුලි සංදේශ ක්‍රමයට—

(i) සම්බන්ධ කිරීමට බලපත්‍රයෙන් අවසර දෙනු ලැබ නොමැති වෙනත් යම් විදුලි සංදේශ ක්‍රමයක්; හෝ

(ii) සම්බන්ධ කිරීමට බලපත්‍රයෙන් අවසර දෙනු ලැබ නොමැති වෙනත් විදුලි සංදේශ උපකරණයක්

සම්බන්ධ කළහොත්; හෝ

(ආ) සැපයීමට බලපත්‍රයෙන් අවසර දෙනු ලැබ නොමැති විදුලි සංදේශ සේවා, බලපත්‍රය දෙනු ලැබුවේ යම් විදුලි සංදේශ ක්‍රමයක් සඳහා ද ඒ විදුලි සංදේශ ක්‍රමය මගින් සපයනු ලැබුවහොත්.

බලපත්‍ර අවශ්‍යතා නිදහස් කිරීම.

20. (1) 17 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වී තිබුණ ද, මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන අවස්ථාවල දී බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේ ය.

(අ) පහත දැක්වෙන ආකාරයේ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට, එනම්—

(i) විදුලි සංදේශ ක්‍රමයක ගෙන යනු ලබන දේවල් එසේ ගෙන යාමට සම්බන්ධ වන එකම කාරකය ආලෝකය වන අතර එමගින් ගෙන යනු ලබන දෙයක් දෙඇසින් පමණක් ප්‍රතිග්‍රහණය කිරීමට හෝ ඇකීමට හැකි වන විටක, එකී විදුලි සංදේශ ක්‍රමය;

(ii) විදුලි සංදේශ ක්‍රමයට අඩංගු සියලු උපකරණ—

(අඅ) අයිතිකරුගේ හෝ කුලී ග්‍රාහියාගේ තනි ප්‍රයෝජනය සඳහා තනි අයිතියක් ඇති හෝ කුලියට දී ඇති ස්ථානයක සහ යාබද මායිමක් ඇතුළත පිහිටි සහ යම් බලපත්‍ර ලත් ක්‍රමයකට සම්බන්ධ කර නොමැති; හෝ

(ආආ) වාහනයක, යාත්‍රාවක, ගුවන් යානයක, හවර් යානයක හෝ යාන්ත්‍රිකව එකට ඈඳා ඇති වාහන, යාත්‍රා, ගුවන් යානා හෝ හවර්යානා දෙකක හෝ වැඩි ගණනක පිහිටි

වෙනත් විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ කර නොමැති විදුලි සංදේශ ක්‍රමයක්; හෝ

(iii) යම් විදුලි සංදේශ ක්‍රමයක් තනි පුද්ගලයකු ක්‍රියාත්මක කරන; සහ

(අඅ) එහි අඩංගු සියලු උපකරණ ඔහුගේ පාලනයට යටත් වන; සහ

(ආආ) එමගින් ගෙන යනු ලබන සෑම දෙයක්ම ඔහුගේම ගෘහ කාර්ය සඳහා පමණක් ගෙන යනු ලබන

අවස්ථාවක, ඒ ඒ විදුලි සංදේශ ක්‍රමය; හෝ

(ආ) ක්‍රියාකරුවකුගේ පොදු ස්විච්කරන ලද පද්ධතියට අනුමත පර්යන්ත උපකරණ සම්බන්ධ කිරීම සඳහා; හෝ

(ඇ) යම් තැනැත්තකු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන සහ ඒ ව්‍යාපාරයේ කාර්ය සඳහා, වෙනත් විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ කර නොමැති, විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නාවූ ද ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන කොන්දේසි ඉටු කර තිබෙන්නා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා සඳහා;

ඒ කොන්දේසි නම්,—

(i) ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තා හැර වෙනත් තැනැත්තකු එම ක්‍රමයට අඩංගු උපකරණවල පාලනයට සම්බන්ධ නොවීම;

(ii) එම ක්‍රමය මගින් ගෙන යනු ලබන ශබ්ද හෝ දෘශ්‍ය ප්‍රතිරූප, ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තා හෝ එම ව්‍යාපාරය කර ගෙන යාමේ දී ඔහුගේ යම් සේවා නියුක්තයන් නොවන වෙනත් තැනැත්තන් විසින් ශ්‍රවණය කිරීමේ හෝ දැකීමේ කාර්ය සඳහා ගෙන යනු නොලැබීම;

(iii) එම ක්‍රමය මගින් ගෙන යනු ලබන පණිවුඩ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තාට හෝ එම ව්‍යාපාරය කරගෙන යාමේ දී සේවයේ නියුක්ත කර සිටින ඔහුගේ යම් සේවා නියුක්තයන්ට හෝ එම ව්‍යාපාරය කර ගෙන යන අතරතුර ඔහු විසින් භාවිතා කරනු ලබන හා පාලනය කරනු ලබන, ඒ ක්‍රමයේ උපකරණ මගින් ප්‍රතිග්‍රහණය කිරීම සඳහා හෝ සම්ප්‍රේෂණය කිරීම සඳහා ගෙන යනු ලැබීම;

(iv) එම ක්‍රමය මගින් ගෙන යනු ලබන පණිවුඩ, එම ව්‍යාපාරය කර ගෙන යන අතරතුර නොවන අවස්ථාවල දී භාවිත කරනු ලබන යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ක්‍රියාත්මක කිරීමේ හෝ පාලනය කිරීමේ කාර්යය සඳහා ගෙන යනු නොලැබීම; සහ



(v) "විදුලි සංදේශ ක්‍රමය" යන යෙදුමෙහි අර්ථකථනයේ අර්ථානුකූල වූ කිසිම දෙයක් ව්‍යාපාරය කරගෙන යන තැනැත්තා නොවන වෙනත් තැනැත්තකු වෙත එම ක්‍රමය මගින් ගෙන යනු නොලැබීම;

(ඈ) පොලිසිය, සන්නද්ධ හමුදා සහ ජාතික ආරක්ෂාව සඳහා රජය විසින් කෙළින්ම සේවයේ නියුක්ත කර ගෙන ඇති වෙනත් යම් සේවාවක් විසින් තම නිල කාර්ය ඉටු කිරීමේදී මේ පනතේ විධිවිධානවලට යටත්ව විදුලි සංදේශ ක්‍රම හෝ විදුලි සංදේශ උපකරණ භාවිතා කිරීම සඳහා;

එසේ වුව ද, බලධරයා විසින් සඳහන් කරනු ලබන තාක්ෂණ නියමයන් ඔවුන් විසින් පිළිපැදිය යුතු ය;

(ඉ) රජයේ සේවයේ යෙදී ඇති යම් යුද්ධ නැවක් හෝ ගුවන් යානයක් තුළ විදුලි සංදේශ ක්‍රම හෝ උපකරණ භාවිතා කිරීම සඳහා; හෝ

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද යම් විදේශ සිවිල් ගුවන් යානයක් තුළ භාවිතා කරනු ලබන යම් විදුලි සංදේශ ක්‍රමයකට හෝ උපකරණවලට සහ එම ක්‍රමය හෝ උපකරණ භාවිතා කරන, ගුවන් යානයේ ගුවන් නැව් පිරිසේ සාමාජිකයන්ට, එම ක්‍රමය හෝ උපකරණ ගුවන් යානයේ සවි කිරීම හෝ භාවිතා කිරීම පිළිබඳව තත් කාලයේ වලංගුව පවතින යම් අන්තර්ජාතික සම්මුතියක නියමයන්ට අනුකූලව විශේෂයෙන් බලපත්‍ර නිකුත් කර ඇත්නම්, එම ක්‍රමය හා උපකරණ භාවිතා කිරීම සඳහා.

(2) (අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් විදුලි සංදේශ ක්‍රමයක්, ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන තැනැත්තා පදිංචිව සිටින ස්ථානයට අනුරූප ප්‍රදේශයක මායිම් ඉක්මවා ව්‍යාප්ත වන අවස්ථාවක, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී එවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කරන හෝ එම දිනයේ දී හෝ ඉන් පසුව එවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සෑම තැනැත්තකුම විසින්, එම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කොන්දේසියක් වශයෙන්—

(i) ක්‍රියාත්මක කරනු ලබන හෝ ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයේ වර්ගය, එම ක්‍රමය පිහිටි වන ස්ථානය සහ එහි මායිම් පිළිබඳව බලධරයාගෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය;

(ii) එම ක්‍රමය සම්බන්ධයෙන්, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල හෝ රීතිවල යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරමින් විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කරන තැනැත්තෙක් ඉන් මේ පනත යටතේ වරදක් කරන අතර, ඒ ක්‍රමය ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබීම බලධරයා විසින් තහනම් කළ හැකි ය.

(3) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) (iii) හෝ (ඇ) ඡේදයේ සඳහන් විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කරන තැනැත්තකු හා ක්‍රියාකරුවකු අතර ඔවුන්ගේ විදුලි සංදේශ ක්‍රම අන්තර් සම්බන්ධනය සඳහා එකඟවීමක් කර නොමැති අවස්ථාවක, අන්තර් සම්බන්ධනයට පළමුව එම තැනැත්තා විසින් එම අන්තර් සම්බන්ධනය සඳහා බලධරයාගෙන් බලපත්‍රයක් ලබා ගත යුතු ය.

(ආ) (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින තැනැත්තෙක් ඉන් මේ පනත යටතේ වරදක් කරන අතර ඔහු විසින් එම ක්‍රමය දිගටම ක්‍රියාත්මක කරනු ලැබීම බලධරයා විසින් තහනම් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් අන්තර් සම්බන්ධනයක් නිරීක්ෂණය කරන ලෙස බලධරයාගෙන් ඉල්ලා සිටීම මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ සහ තාක්ෂණික ප්‍රමිතිවල යහපත පිණිස වේ යයි ක්‍රියාකරුවකු විසින් අදහස් කරන්නේ නම්, එය නිරීක්ෂණය කරන ලෙස ඔහු විසින් බලධරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එසේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, බලධරයා විසින් ඒ ඉල්ලීමට අනුකූලව ක්‍රියා කිරීමට උචිත ක්‍රියා මාර්ග ගත යුතු ය.

විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය කිරීම සහ ආනයනය කිරීම, පාලනය කිරීම සහ විධිමත් කිරීම.

21. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට බලධරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර ඒ තැනැත්තා විසින්—

(අ) යම් විදුලි සංදේශ උපකරණයක් වෙළෙඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම; හෝ

(ආ) (20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන යම් උපකරණයක් නොවන) යම් විදුලි සංදේශ උපකරණයක්, ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක හෝ වාහනයක හෝ එහි දේශීය ජලතීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක ස්ථාපනය කිරීම, පිහිටුවීම, ක්‍රියා කරවීම හෝ ක්‍රියා කරවීමට සැලැස්වීම,

නොකළ යුතු ය.

මෙහි (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතිය අනුව බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.



(2) (1) වන උපවගන්තියේ සඳහන් වන යම් කාර්යයක් සඳහා බලධරයා විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් වන යම් කාර්යයක් හෝ ක්‍රියාවක් හෝ එකී කාර්ය සහ ක්‍රියා සංකලනයක් සඳහා විය යුතු ය;

(ආ) බලධරයාගේ හෝ තත් කාර්යය සඳහා බලධරයා විසින් බලය දෙන ලද නිලධරයකුගේ අත්සන යොදා දිය යුතු ය;

(ඇ) නියමිත ගාස්තුව ගෙවූ විට නිකුත් කළ යුතු ය;

(ඈ) බලධරයා විසින් නිර්ණය කරනු ලබන කොන්දේසිවලට සහ සීමාකිරීම්වලට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් යටත් වන යම් කොන්දේසියක් හෝ සීමා කිරීමක් කඩ කරනු ලැබූ විටක හෝ ඒ යටතේ ගෙවිය යුතු යම් ප්‍රතිෂ්ඨාවක් ගෙවීම පැහැර හරින ලද විටක හෝ ඊට අදාළව මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හරින ලද විටක, බලධරයා විසින් ඕනෑම වේලාවක ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කර, අවසාන කළ හැකි ය.

(4) බලධරයා විසින්—

(අ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත්; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත්

අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු විසින් හෝ බලපත්‍රලාභියා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට විරුද්ධව, බලධරයාගේ තීරණය ඔහුට දැනුම් දුන් දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර ඔහු විසින් ඒ අභියාචනය මත බලධරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ නිෂ්ප්‍රභා කිරීම කළ හැකි ය.

(5) (1) වන උපවගන්තිය උල්ලංඝනය කරන සෑම තැනැත්තෙක්ම ඉන් මේ පනත යටතේ වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හැරියහොත්, තුන් මාසයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට ඔහු යටත් වන්නේ ය.

යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය.

22. (1) තත් කාර්යය සඳහා (2) වන උපවගන්තිය යටතේ බලධරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පාවිච්චි නොකළ යුතු ය.

මෙහි (2) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක්ම නියමිත ආකෘතිය අනුව බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් කාර්යයක් සඳහා බලධරයා විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) නියමිත ආකෘතියේ සහ බලධරයාගේ හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකුගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබිය යුත්තේ ය ;

(ආ) නියමිත ගාස්තුව ගෙවන ලද විට, නිකුත් කරනු ලැබිය යුතුය ; සහ

(ඇ) බලධරයා විසින් තීරණය කරන ලද කොන්දේසි සහ සීමා කිරීම් කඩ කරන ලද විටක, නියමිත සංඛ්‍යාත උපකරණ පාවිච්චි කිරීම තහනම් කිරීමද ඇතුළත් විය හැකි එකී කොන්දේසි සහ සීමාකිරීම්වලට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක් යටත් වන යම් කොන්දේසියක් හෝ සීමාකිරීමක් කඩ කරනු ලැබූ විටක හෝ ඒ යටතේ ගෙවිය යුතු යම් ප්‍රතිෂ්ඨාවක් ගෙවීම පැහැර හරින ලද විටක හෝ ඊට අදාළව මේ පනත යටතේ තත් කාලයේ බලාත්මකව පවත්නා යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හරින ලද විටක, බලධරයා විසින් ඕනෑම වේලාවක ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කර අවසාන කළ හැකි ය.

(4) බලධරයා විසින්—

(අ) බලපත්‍රයක් ලබා ගැනීම සඳහා (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත්

අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු විසින් හෝ බලපත්‍රලාභියා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට විරුද්ධව, බලධරයාගේ තීරණය ඔහුට දැනුම් දුන් දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. ඔහු විසින් ඒ අභියාචනය මත බලධරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කළ හැකිය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පාවිච්චි කරන තැනැත්තෙක් ඉන් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

III වන කොටස

විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දේපළ, අයිතිවාසිකම් හා බැඳීම් පැවරීම

විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දේපළ ශ්‍රී ලංකා ටෙලිකොම් නමැති සංස්ථාවට පැවරීම.

23. (1) (2) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම් මගින් බැහැර කරන ලද දේපළ, අයිතිවාසිකම් සහ බැඳීම් හැර, පැවරීමේ දිනයට පෙරාතුවම විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට හිමිව තිබූ හෝ එම දෙපාර්තමේන්තුව යටත්ව සිටියාවූ සියලු දේපළ, අයිතිවාසිකම් සහ බැඳීම් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "පැවරීමේ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක, 1990 පෙබරවාරි මස 6 වන දින අංක 596/11 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මගින් පිහිටුවන ලද (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ටෙලිකොම්" නමැති සංස්ථාව වෙත පැවරෙන්නේ ය.



(2) පැවරීමේ දිනයට පෙර ඕනෑම වේලාවක, අමාත්‍යවරයා විසින් සහ සංස්ථාව විසින්, ඒ දිනයට පසුව විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට ඉතිරි වී තිබිය යුතු දේපළ අයිතිවාසිකම් සහ බැඳීම් කවරේද යන වග ලියවිල්ලකින් ගිවිසගත හැකි ය.

ගිවිසුම අයිතිවාසිකම් යනාදිය පැවරීම සහ සතු කිරීම.

24. 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම මගින් අන් ආකාරයකින් බැහැර කර ඇති පරිදි හැර, පැවරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි—

(අ) විදුලි සංදේශ දෙපාර්තමේන්තුව විසින් හෝ එම දෙපාර්තමේන්තුව සමඟ හෝ එම දෙපාර්තමේන්තුව සඳහා ඇතුළත් වූ ද, පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ පවතින සියලු ගිවිසුම්, බදු හෝ නිවාස බදු ගිවිසුම්, එම දිනයේ සිට සංස්ථාව විසින් හෝ ඒ සමඟ හෝ සංස්ථාව සඳහා ඇතුළත් වූ ගිවිසුම්, බදු හෝ නිවාස බදු ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(ආ) පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ පවතින විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සියලු සම්බන්ධතා, අයිතිවාසිකම්, පරවශතා, වගකීම්, ණය හා බැඳීම්, එම දිනයේ සිට සංස්ථාවේ සම්බන්ධතා, අයිතිවාසිකම්, පරවශතා, වගකීම්, ණය හා බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ පවතින, විදුලි සංදේශ දෙපාර්තමේන්තුව විසින් සවි කරන ලද සහ නඩත්තු කරන ලද හෝ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව විසින් සවි කරනු ලබමින් තිබෙන සහ නඩත්තු කරනු ලබමින් තිබෙන සියලු සවිකිරීම්, පිරියත් සහ උපකරණ සහ වෙනත් දේපළ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විදුලි සංදේශ සේවය පවත්වාගෙන යාමට හෝ සැපයීමට අවශ්‍ය වන සහ භාවිතා කරනු ලබන සංවරාකාරයක වූ හෝ සියලු කාරණා හා දේවල් එම දිනයේ සිට සංස්ථාවට පවරනු ලැබිය යුතු අතර සංස්ථාව වෙත සතු විය යුතු ය.

(ඈ) මේ පනත යටතේ සංස්ථාවට පවරන ලද විදුලි සංදේශ ක්‍රමය සම්බන්ධයෙන් හෝ ඒ සඳහා හෝ ඒ වෙනුවෙන් පැවරීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ ආණ්ඩුවට ලැබිය යුතු සහ අයවිය යුතු හෝ ඒ පැවරීම සිදු නොවූයේ නම්, පැවරීමේ දිනයට පසුව ආණ්ඩුවට ලැබිය යුතු වන යම් මුදල් අයකර ගැනීමේ හෝ ලබාගැනීමේ අයිතිවාසිකම් සංස්ථාවට තිබිය යුතු ය.

*පැවරීම නිසා නිශ්චල දේපළ පිළිබඳව පරම හිමිකම සංස්ථාවට පැවිය යුතු බව.*

25. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, 23 වන වගන්තිය ප්‍රකාර යම් නිශ්චල දේපළක් හෝ එහි යම් සම්බන්ධතාවක් සතුවීම නිසා, වැඩිදුර ඔප්පු කිරීමකින් තොරව ද ලියාපදිංචි කිරීමේ යම් අවශ්‍යතාවයක් නොමැතිව ද, ඒ සියලු දේපළ හෝ එහි යම් සම්බන්ධතාවක් පිළිබඳ පරම හිමිකම සංස්ථාවට ලැබෙන බව සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

*තුන්වන පාර්ශ්ව කරුවන්ගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන බව.*

26. 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ගිවිසුම මගින් බැහැර කරන ලද දේපළ, අයිතිවාසිකම් සහ බැඳීම් නොවන, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සියලු දේපළ, අයිතිවාසිකම් සහ බැඳීම්, සංස්ථාවට පැවරීම, පැවරීමේ දිනයට පෙරාතුව වූ දිනයේ තුන්වන පාර්ශ්වකරුවකු සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව අතර පවතින යම් ගිවිසුමක් හෝ එකඟවීමක් සම්බන්ධයෙන් එම තුන්වන පාර්ශ්වකරුට ඇති අයිතිවාසිකම්වලට කවර හෝ ආකාරයකින් හානිකර ලෙස බලපාන ලෙස නොසැලකිය යුතු අතර, එවැනි සෑම ගිවිසුමක්ම හෝ එකඟවීමක්ම, එම ගිවිසුමේ හෝ එකඟවීමේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව ගැන ඇති සෑම සඳහනක්ම සංස්ථාව ගැන කරන ලද සඳහනක් වූ විටක මෙන්, සංස්ථාව සඳහා හෝ සංස්ථාවට එරෙහිව වලංගු වන අතර බලාත්මක ද කළ හැකි වන්නේ ය.

*මෙතෙක් විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කරන ලද සහ ඉටු කරන ලද විධිමත් කිරීමේ බලතල, කර්තව්‍ය සහ කාර්ය බලධරයා විසින් ක්‍රියාත්මක කළ හැකි බව සහ ඉටුකළ හැකි බව.*

27. පැවරීමේ දින සිට සහ ඉන් පසුව,—

(අ) යම් ලිඛිත නීතියකින්, විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා වෙත සතු කර දෙන ලද හෝ වෙන් කර දෙන ලද හෝ පවරා දෙන ලද යම් බලතල, කර්තව්‍ය හෝ කාර්ය බලධරයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු අතර ඒ දින සිට හා ඉන් පසුව විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා ඉහත කී සියලු බලතල, කර්තව්‍ය හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අවසාන කළ යුතු ය.

(ආ) යම් ලිඛිත නීතියක හෝ යම් ලිඛිත නීතියකින් නියම කර ඇති හෝ බලය දී ඇති යම් දැන්වීමක හෝ වෙනත් ලේඛනයක හෝ ආකෘතියක (නාමින් හෝ සම්පූර්ණ පදවියෙන් හෝ පදවිය කෙටියෙන් යොදා හෝ) විදුලි සංදේශ අධ්‍යක්ෂ ගැන සඳහන් කර ඇති සෑම අවස්ථාවක දීම, "විදුලි සංදේශ අධ්‍යක්ෂ" යන වචන වෙනුවට 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පත් කරන ලද "විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචනය ආදේශ විය යුතු ය.

## IV වන කොටස

### විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් සංස්ථාවේ සේවයේ නියුක්ත කරවීම

*පැවරීමේ දිනයට පෙර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් විසින් නිවේදනයක් දිය යුතු බව.*

28. රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ කුමක් සඳහන් වී තිබුණ ද, පහත දැක්වෙන විධිවිධාන විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් සංස්ථාවේ සේවා නියුක්ත කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය :—



(අ) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයකු වන හා ආණ්ඩුවේ ස්ථාන මාරු සහිත සේවයකට අයත් නොවන විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සෑම රජයේ නිලධරයකු විසින්, පැවරීමේ දිනයේදී—

(i) දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු ලෙස දිගටම ධූරය දැරීමට ; හෝ

(ii) විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන්, ඒ දිනයේදී ඔහු අවුරුදු දහයකට නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටු කර තිබේ නම්, රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගෙන සංස්ථාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(iii) විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත නිලධරයකු වශයෙන් ඒ දිනයේ දී ඔහු අවුරුදු දහයකට අඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් ඉටු කර තිබේ නම්, රජයේ සේවයෙන් අස් වී, සංස්ථාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(iv) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකු වේ නම්, රජයේ සේවයෙන් අස් වී, සංස්ථාවේ සේවා නියුක්තයකු වීමට ; හෝ

(v) රජයේ සේවයෙන් විශ්‍රාම ලබා ගෙන හෝ අස් වී, සංස්ථාවේ සේවා නියුක්තයකු නොවීමට

ඔහු අදහස් කරන බව පැවරීමේ දිනයට පෙර ලියවිල්ලකින් විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා වෙත නිවේදනයක් කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ පැවරීමේ දිනයට පෙර, විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා වෙත දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු විසින් දෙන ලද නිවේදනයක් අවසානාත්මක වන්නේ ය.

*28 (අ) වන වගන්තිය යටතේ නිවේදනයක් නොදීමේ හෝ 28 (අ) (i) වන වගන්තිය යටතේ නිවේදනයක් දීමේ ප්‍රතිඵලය.*

29. (1) 28 වන වගන්තියේ (අ) ඡේදයේ (ii), (iii), (iv) හෝ (v) වන අනු ඡේදය යටතේ දිය යුතු නිවේදනය පැවරීමේ දිනයට පෙර නොදෙන හෝ (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ දිය යුතු නිවේදනය දෙන විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයෙක් එම දිනයේ දී සහ ඉන් පසු විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු ලෙස දිගටම ධූරය දරන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් රජයේ නිලධරයකු විසින්, ඔහු ඒ ධූරය දිගටම දරන තාක් දුරට, ඒ නිලධරයාගේ තනතුරේ නමින්, සංස්ථාව සඳහා සහ වෙනුවෙන්, වැඩ කළ යුතු අතර, ඒ නිලධරයාගේ තනතුරෙහි විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට වැඩ කළ කාලයේදී ඔහුට හිමිකම් තිබුණ සේවා කොන්දේසිවලටම ඔහු හිමිකම ලබන්නේ ය. තවද, එමනාත් රජයේ නිලධරයකු යටතේ වන විනය පාලනයටම ඔහු ද යටත් වන්නේ ය.

(3) විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ තත්ත්වයෙන්, පැවරීමේ දින සහ ඉන් පසු, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් වැඩ කරමින්, ඒ නිලධරයා වශයෙන් දිගටම ධූරය දරන අවස්ථාවක, ඒ නිලධරයා සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල් ද, ඇතුළුව වැටුප් සහ වෙනත් වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් ලෙස මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් නොඉක්මවන මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස, සංස්ථාවේ මුදල් වලින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට සංස්ථාව විසින් ගෙවිය යුතු ය.

28 වන වගන්තියේ (අ) ඡේදයේ (ii) සිට (v) දක්වා අනුඡේද යටතේ නිවේදනයක් දීමේ ප්‍රතිඵලය.

30. (1) 28 වන වගන්තියේ (අ) ඡේදයේ (ii), (iii), (iv) හෝ (v) වන අනුඡේදය යටතේ පැවරීමේ දිනයට පෙර නිවේදන යක් කරන විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ යම් රජයේ නිලධරයෙක්—

(අ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ නම්, පැවරීමේ දින සිට සහ ඉන් පසුව, සංස්ථාවේ සේවා නියුක්තයකු වන අතර, 31 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දිනයේදී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබෙන විශ්‍රාම වැටුපට ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය; නැතහොත්

(ආ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iii) අනුඡේදය යටතේ නම්, පැවරීමේ දින සිට සහ ඉන් පසුව, සංස්ථාවේ සේවානියුක්තයකු වන අතර ඒ දිනයේ දී ඔහු රජයේ සේවයෙන් ඉවත් වූ ලෙස සලකනු ලබන්නේ ය. තවද, 31 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබෙන දීමනාව ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය; නැතහොත්

(ඇ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (iv) අනුඡේදය යටතේ නම්, පැවරීමේ දින සිට සහ ඉන් පසුව, සංස්ථාවේ සේවා නියුක්තයකු වන අතර සේවයෙන් පහ කිරීමේ හේතුවෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව කිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු ආණ්ඩුවේ සේවයෙන් ඉවත් වූ ලෙස රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය; නැතහොත්

(ඈ) ඔහු විසින් නිවේදනය දෙනු ලැබුවේ ඒ ඡේදයේ (v) අනුඡේදය යටතේ නම්, සහ—

(i) ඔහු ඒ ඡේදයේ (ii) අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, පැවරීමේ දිනයේදී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ දිනයේදී ධූරය



අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබෙන විශ්‍රාම වැටුපට ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය;

(ii) ඔහු ඒ ඡේදයේ (iii) අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් රජයේ නිලධරයකු නම්, පැවරීමේ දිනයේ දී රජයේ සේවයෙන් අස් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ දිනයේ දී ධූරය අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් ඉවත් වූයේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ඔහුට ප්‍රදානය කරනු ලැබෙන දීමනාවට ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය; නැතහොත්

(iii) ඔහු ඒ ඡේදයේ (iv) අනුඡේදයේ සඳහන් පංතියට හෝ විස්තරයට අයත් නිලධරයකු නම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ කාර්ය සඳහා සේවයෙන් පහ කිරීමේ හේතුව මත නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව කිවිසුමක් අවසාන කිරීමෙන් ඔහු ඒ දිනයේ දී ආණ්ඩුවේ සේවයෙන් අස් වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සහ 29 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සහ මේ පනතේ වෙනත් යම් විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවයක් ඇති වූ විටක, ඒ ගැටුමේ හෝ අනනුකූලතාවේ ප්‍රමාණයට, ඒ උපවගන්තිවල විධිවිධාන ඒ වෙනත් විධිවිධාන අභිබවා බලපවත්වන්නේ ය.

සංස්ථාවේ ඇතැම් සේවා නියුක්තයන්ට අදාළ වන විශේෂ විධිවිධාන.

31. 30 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මකවීම නිසා පැවරීමේ දිනයේදී සංස්ථාවේ සේවානියුක්තයකු බවට පත් වූ යම් සේවා නියුක්තයකුට සහ ඒ සේවානියුක්තයා සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ වන්නේ ය:—

(අ) ඒ සේවානියුක්තයා සහ සංස්ථාව එකඟ වන නියමයන් සහ කොන්දේසි මත ඒ සේවානියුක්තයා සංස්ථාව විසින් සේවයේ නියුක්ත කළ යුතු ය:

එසේ වුව ද ඒ නියමයන් සහ කොන්දේසි ඒ සේවා නියුක්තයා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ කලින් සේවයේ නියුක්ත කරනු ලැබුවේ යම් නියමයන් සහ කොන්දේසි මතද, ඒ නියමයන්ට සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවිය යුත්තේ ය;

(ආ) පැවරීමේ දිනයේ දී ඒ සේවානියුක්තයා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශිත තනතුරක් දරමින් සිටි සහ අවුරුදු දහයකට අඩු නොවන් අවුරුදු අවසාන නොඅඩු විශ්‍රාම වැටුප් සහිත සේවයක් කර ඇති රජයේ නිලධරයකු වී නම්—

(i) ආණ්ඩුව යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයට යම් කාලයක් එකතු කළ විට අවුරුදු දහ යක සමස්ත විශ්‍රාම වැටුප් සහිත සේවා කාලසීමා

වක් සම්පූර්ණ වන විටක ඒ කාලසීමාව දක්වා ඔහු පැවරීමේ දිනයේදී විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දැරූ තනතුර දරමින් සිටි ලෙස විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යය සඳහා පමණක් සලකනු ලැබිය යුතු ය. (ඒ සමස්ත කාලසීමාව ආගණනය කිරීම සඳහා, සංස්ථාව යටතේ සේවය ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.);

(ii) පැවරීමේ දිනයේදී ඔහු විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දැරූ තනතුර යම් කාලසීමාවක් තුළ ඔහු දැරූ බවට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලබන විට, ඒ කාල සීමාවේ එක් එක් සම්පූර්ණ මාසය වෙනුවෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන මුදලක් ඔහු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා සංස්ථාවේ මුදල්වලින් සංස්ථාව විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය; තව ද

(iii) (i) අනුඡේදයේ සඳහන් කාලසීමාව අවසානයේදී ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එම කාල සීමාව අවසානයේදී තනතුර අහෝසි කිරීමේ හේතුව මත ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේ නම්, ඔහුට විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ ප්‍රදානය කරනු ලබන විශ්‍රාම වැටුපක් ලැබීමට ඔහු හිමිකම් ලබන්නේ ය.

(ඇ) 30 වන වගන්තියේ විධිවිධානවල සහ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණද, එමෙන්ම වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වී තිබුණද, 30 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නිසා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු සංස්ථාවේ සේවා නියුක්තයකු බවට පත් වන අවස්ථාවක—

(i) පැවරීමේ දිනයේදී හෝ ඊට පසුව විශ්‍රාම වැටුපකට ඒ නිලධරයා සුදුසුකම් ලැබුවේ නම් සහ ඔහුගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප ලබා ගැනීමට ඔහු නිර්ණය කළහොත්, සංස්ථාවේ ඔහුගේ සේවානියුක්ති කාලය ඇතුළත එම විශ්‍රාම වැටුප ඔහුට නොගෙවනු ලැබිය යුතු ය;

(ii) ඒ නිලධරයා විශ්‍රාම වැටුපකට සුදුසුකම් ලබා තිබේ නම් සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (i) වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, ඔහුගේ විශ්‍රාම වැටුපෙන් හතරෙන් එක කොටසක් පාරිතෝෂිකයක් ලෙස ලබා ගැනීමට නිර්ණය කළහොත්—



(අ) ඒ පාරිතෝෂිකය ඔහුට නොගෙවිය යුතු අතර එය සංස්ථාවේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය;

(ආ) එකී ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපේ ඉතිරි හතරෙන් තුන් පංගුව ඔහු සංස්ථාවේ සේවයේ නියුක්තව සිටින කාලය තුළ ඔහුට නොගෙවනු ලැබිය යුතු ය;

(ඇ) එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 2අ (1) (ii) වන වගන්තියේ සඳහන් "ඔහු විශ්‍රාම ලැබූ දිනයේ සිට අවුරුදු දහයක" කාලසීමාව ගණන් බැලීමේ කාර්ය සඳහා, ඔහු සංස්ථාවේ සේවයේ නියුක්තව සිටි අවසාන දිනය ඔහු විශ්‍රාම ලැබූ දිනය ලෙස සැලකිය යුතු ය;

(iii) ඒ නිලධරයා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපකට නොව පාරිතෝෂිකයකට හිමිකම ලබා තිබේ නම්, ඒ පාරිතෝෂිකය ඔහුට නොගෙවිය යුතු අතර, සංස්ථාවේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය; තව ද

(iv) රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ යම් මුදල් ප්‍රමාණයක් ලැබීමට ඒ නිලධරයා හිමිකම ලබා තිබේ නම්, ඒ මුදල ඔහුට නොගෙවිය යුතු අතර, සංස්ථාවේ අනුමත අර්ථසාධක අරමුදලක ඔහුගේ ගිණුමට බැර කළ යුතු ය.

32. (1) විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයකු වශයෙන් වූ තමාගේ තත්ත්වයෙන් පැවරීමේ දිනයේදී හා ඉන් පසුව සංස්ථාව සඳහා සහ වෙනුවෙන් කාර්ය ඉටු කරන අතරම පැවරීමේ දිනයේදී සහ ඉන් පසුව විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඒ රජයේ නිලධරයා වශයෙන් තම තනතුර කොතෙක් දරන යම් තැනැත්තකු, කවර හෝ අවස්ථාවකදී, සංස්ථාවේ කාර්ය මණ්ඩල යට, ඔහුගේ කැමැත්ත ඇතිව, පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් රජයේ නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ සංස්ථාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 10 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් විශයෙන් ඒ තත්ත්වයෙන් සංස්ථාව සඳහා සහ වෙනුවෙන් කාර්ය ඉටුකරන අතරම, පැවරීමේ දිනයේදී හෝ ඉන් පසුව දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් වශයෙන් දිගටම සේවය කරන තැනැත්තන්ට අදාළ වන විධිවිධාන.

## V වන කොටස

### විදුලි සංදේශ සේවා ස්ථාපනය කිරීම සඳහා පවත්වා ගෙන යාම සඳහා රජයේ හෝ පෞද්ගලික දේපළ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම

විදුලි සංදේශ මාර්ග සහ කණු ස්ථාපනය කොට, පවත්වා ගෙන යාමට ක්‍රියාකරුට ඇති බලය.

33. (1) ක්‍රියාකරුවකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබුවේ යම් විදුලි සංදේශ ක්‍රමයක් සඳහා ද, ඒ විදුලි සංදේශ ක්‍රමය මගින් විදුලි සංදේශ සේවාවක් සැපයීමේ කාර්ය සඳහා, ක්‍රියාකරු විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, කලින් කල යම් බිම්වල දේපළක් යටින්, උඩින්, ඔස්සේ හෝ හරහා විදුලි සංදේශ මාර්ග ද, ඒ දේපළ ඇතුළත හෝ මතුපිට විදුලි සංදේශ කණු ද ස්ථාපනය කොට පවත්වා ගෙන යා හැකි අතර ඒ කාර්ය සඳහා ක්‍රියාකරුගේ සේවයේ නියුක්ත යම් නිලධරයකු විසින් ද, ඒ නිලධරයා විසින් හෝ ඔහු යටතේ හෝ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින සේවකයන්, වැඩකරුවන් හා කම්කරුවන් විසින් ද පහත සඳහන් දේ කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) සාධාරණ දැන්වීමක් දී, සියලු වේලාවන්හි අවශ්‍ය සියලු වාහන, යන්ත්‍ර සූත්‍ර මෙවලම් සහ වෙනත් උප කරණ ද සහිතව යම් ඉඩමකට ඇතුළු වී, යම් විදුලි සංදේශ මාර්ගයකට ආධාරක වශයෙන් අවශ්‍ය විය හැකි, යම් කණු එහි සිටුවීම ; සහ

(ආ) ඒ ඉඩමේ වැවෙන යම් ගසකට හෝ ඒ ඉඩමේ ඇති යම් ගොඩනැගිල්ලකට, ආකෘතියකට හෝ දෙයකට, ඒ විදුලි සංදේශ මාර්ගය සඳහා යම් මුක්කුවක් හෝ වෙනත් ආධාරකයක් සවි කිරීම හෝ සම්බන්ධ කිරීම ; සහ

(ඇ) යම් විදුලි සංදේශ මාර්ගයකට යම් අයුරකින් හානියක් සිදු කළ හැකි හෝ හානියක් සිදු කිරීමට, බාධකයක් වීමට හෝ අවහිරයක් වීමට ඉඩ ඇති යම් ගසක් හෝ ගසක ශාඛාවක් කපා දැමීම ; සහ

(ඈ) යම් විදුලි සංදේශ මාර්ගයක්, පිහිටුවීමේ, ඉදිකිරීමේ, අලුත්වැඩියා කිරීමේ, වැඩිදියුණු කිරීමේ, පරීක්ෂා කිරීමේ, වෙනස් කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්ය සඳහා හෝ යම් ආකාරයකින් ඒ හා සම්බන්ධ වූ හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කරුණක් හෝ දෙයක් වෙන් වෙන් වශයෙන් කිරීම හා ඉටු කිරීම හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක් කරුණක් හෝ දෙයක් කිරීම ;

එසේ වුව ද,—

(i) යම් විදුලි සංදේශ මාර්ගයක් යම් දේපළක් යටින්, උඩින්, ඔස්සේ, හරහා, ඇතුළතින් හෝ මතුපිට ස්ථාපනය කර ඇති විටක ඒ දේපළේ අයිතිකරුගේ ලිඛිත කැමැත්ත ලබාගෙන තිබිය යුතු හැර, මේ වගන්තියෙන් පවරා දී ඇති බලතල ක්‍රියාකරුවකු විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.



(ii) ක්‍රියාකරුවකු විසින් සපයන ලද හෝ සැපයීමට ඇති විදුලි සංදේශ සේවයක කාර්ය සඳහා හැර, මේ වගන්තියෙන් පවරා දී ඇති බලතල ක්‍රියාකරුවකු විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(iii) යම් විදුලි සංදේශ මාර්ගයක් හෝ කණුවක් යම් දේපළක් යටින්, උඩින්, ඔස්සේ, හරහා, ඇතුළතින් හෝ මතුපිට ස්ථාපනය කර ඇති විටක, ඒ දේපළ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම හැර වෙනත් යම් අයිතිවාසිකමක්, ඒ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන්, ක්‍රියාකරුවකුට අත් නොවන්නේ ය.

(iv) මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි හැර, යම් පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත සතු කර ඇති හෝ එහි පාලනය හෝ කළමනාකරණය යටතේ පවත්නා යම් දේපළක් සම්බන්ධයෙන් ඒ බලතල, අවස්ථානුකූලව පරිදි, ඒ පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ ඒ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලනාධිකාරයේ අවසරය නොමැතිව, ක්‍රියාකරුවකු විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

(v) තවද, මේ වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකරුවකු විසින් යම් දේපළකට ඉතා අඩුවෙන් හානි සිදුවන බවට වගබලා ගත යුතු අතර, යම් දේපළක් සම්බන්ධයෙන් ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, දේපළවලට සම්බන්ධතාවක් දරන සියලුම තැනැත්තන්ට සිදුවී ඇති අලාභ හෝ හානි සඳහා සාධාරණ වන්දියක්, අලාභය හෝ හානිය සිදුවී දවස් තිහක් ඇතුළත ඒ තැනැත්තන් විසින් වන්දි ඉල්ලීම ක්‍රියාකරු වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ගෙවිය යුතු ය.

(2) ක්‍රියාකරුවකු වෙත (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ඔහු විසින් ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් යම් අලාභයක් හෝ හානියක් සිදුවන යම් තැනැත්තකු විසින් වන්දියක් ඉල්ලා එම ක්‍රියාකරුට විරුද්ධව නඩුවක් පැවරීම (1) වන උප වගන්තියේ අනුරු වගන්තියේ (v) වන ඡේදයේ සඳහන් කිසිවකින් වළක්වනු නොලබන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ අනුරු වගන්තියේ (v) වන ඡේදය යටතේ ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණවත් භාවය සම්බන්ධයෙන් යම් ආරාවුලක් ඇති වුවහොත්, අදාළ දේපළ පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය තුළ ද ඒ දිසා අධිකරණය වෙත ආරාවුලට සම්බන්ධ දෙපාර්ශ්වයෙන් යම් පාර්ශ්ව

යන් විසින්, තත් කාර්යය සඳහා වූ ලිඛිත කාර්ය පටිපාටිය අනුව, ඉල්ලීමක් කළ විට, ඒ අධිකාරණය විසින් ඒ ආරාවුල ලිඛිත ආකාරයෙන් නිරණය කළ යුතු ය.

(4) වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් සම්බන්ධයෙන් හෝ සම්බන්ධතාවක් ඇති තැනැත්තන් විසින් වන්දිය බෙදා ගත යුතු අනුපාතය සම්බන්ධයෙන් හෝ යම් ආරාවුලක් ඇති වුවහොත්, ප්‍රමාණවත් යයි සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් හෝ ඉදිරිපත් කර ඇති මුදල ප්‍රමාණවත් බව ආරාවුලට සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන් විසින් ලියවිල්ලකින් පිළිගෙන ඇති හෝ එම මුදල (3) වන උපවගන්තිය යටතේ තීරණය කර ඇති අවස්ථාවක, එසේ පිළිගෙන ඇති හෝ තීරණය කර ඇති මුදල් ප්‍රමාණය ක්‍රියාකරුවකු විසින් ඒ දේපළ පිහිටා ඇත්තේ යම් දිසා අධිකරණයක අධිකරණ බල ප්‍රදේශය තුළ ද, ඒ දිසා අධිකරණයට ගෙවිය හැකි ය. ඒ අධිකරණය විසින් පාර්ශ්වකරුවන්ට දැනුම් දීමෙන් පසුව සහ කරුණු ඉදිරිපත් කිරීමට කැමැත්ත දක්වන පාර්ශ්වකරුවන්ට සවන් දීමෙන් පසුව, එම වන්දිය ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් කවුරුන් ද යන වග හෝ, අවස්ථාවෝචිත පරිදි සම්බන්ධතාවක් ඇති තැනැත්තන් අතර ඒ වන්දිය බෙදා ගැනීමට හිමිකම් ඇත්තේ, කවර අනුපාතයක් අනුව ද යන වග ලිඛිත ආකාරයෙන් තීරණය කළ යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සියලු නඩු කටයුතුවල ගාස්තු දිසා අධිකරණය විසින් තීරණය කළ යුතු ය. (1) වන උපවගන්තියේ අනුරු වගන්තියේ (v) වන ඡේදය යටතේ ගෙවිය යුතු වන්දිය පිළිබඳව ආරාවුලක් ඇති වුවහොත් මිස, කිසිම ගාස්තුවක් ගෙවීමට ක්‍රියාකරුවකු යටත් නොවන අතර එවැනි අවස්ථාවකදී, ඉල්ලුම්කරුගේ හිමිකම්පෑම, අසීමිත බව හෝ ඔහුගේ ගාස්තුවෙන් යම් අඩු කිරීමක් කළ යුතු තරමට එකී ක්‍රියාකරු වෙත හිමිකම් පෑම ඉදිරිපත් කිරීමෙහි ලා ඔහු නොසැලකිලිමත් ලෙස ක්‍රියා කර ඇති බව හෝ ඔහු ක්‍රියාකරුගේ ගාස්තුවෙන් කොටසක් දැරිය යුතු බව හෝ අධිකරණයේ මතය වුවහොත් මිස දිසා අධිකරණය විසින් තීරණය කරන වන්දි මුදල, ක්‍රියාකරු විසින් ප්‍රමාණවත් යයි සලකන ලද මුදල් ප්‍රමාණයට වැඩි වුවහොත්, ගාස්තු ගෙවීමට ක්‍රියාකරු යටත් වන්නේ ය.

(6) ක්‍රියාකරු විසින් ගෙවන ලද යම් වන්දි මුදලක් ලැබූ තැනැත්තාගෙන් ඒ සම්පූර්ණ මුදල හෝ එහි කොටසක් හෝ අයකර ගැනීමට යම් තැනැත්තකුට ඇති අයිතිවාසිකම කෙරෙහි මේ වගන්තියේ ඇති කිසිවකින් බලපෑමක් නොවන්නේ ය.

ක්‍රියාකරු සඳහා නිශ්චිත දේපළ ප්‍රයෝජනයට ගැනීම පිණිස ලිඛිත කැමැත්ත අධිකාරිය විසින් ලබා ගත යුතු බව.

34. (1) යම් නිශ්චල දේපළක අයිතිකරු විසින් 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අනුරු වගන්තියේ (i) ඡේදයේ සඳහන් ලිඛිත කැමැත්ත ක්‍රියාකරුවකුට දීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක ක්‍රියාකරු විසින් ඒ බව බලධරයා වෙත වාර්තා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලධරයා වෙත වාර්තාවක් කර ඇත්තා වූ ද, නිසි පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ක්‍රියාකරුගේ අවශ්‍යතාවල සාධාරණත්වය පිළිබඳව බලධරයා සෑහීමට පත් වී ඇත්තා වූ ද, අවස්ථාවක, එකී දේපළ ප්‍රයෝජනයට ගැනීම සඳහා



එම ක්‍රියාකරු සඳහා සහ ලෙවනුවෙන් එකී ලිඛිත කැමැත්ත ලබා ගැනීම පිණිස සාධාරණ ලෙස අවශ්‍ය යයි තමන් සලකන පියවර බලධරයා විසින් ගත හැකි ය.

33 වන වගන්තියේ අනුරු වගන්තියේ (iv) වන ඡේදය යටතේ, කොන්දේසි වලට යටත්ව, අවසර දීමට පළාත් පාලන ආයතනයකට හෝ රාජ්‍ය සංස්ථාවකට ඇති බලය.

35. (1) පළාත් පාලන ආයතනයක නගරාධිපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ පාලනාධිකාරය විසින් හෝ 33 වන වගන්තියේ අනුරු වගන්තියේ (iv) වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඒ වගන්තිය යටතේ ඇති බලතල සියල්ලම හෝ ඉන් බලතල කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීමට, අදාළ දේපළ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පළාත් පාලන ආයතනය වෙත හෝ රාජ්‍ය සංස්ථාව වෙත ගාස්තුවක් ගෙවීමට යටත්ව සහ යම් වැඩක් කිරීමේ වේලාව හෝ ආකාරය සම්බන්ධයෙන් හෝ ඒ වගන්තිය යටතේ ක්‍රියාකරුවකු විසින් භාරගෙන ඇති යම් වැඩක් හා සම්බන්ධ හෝ වැඩකට අදාළ වෙනත් දෙයක් සම්බන්ධයෙන් වූ කොන්දේසිවලට යටත්ව, ක්‍රියාකරුවකුට අවසර දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළාත් පාලන ආයතනයකට හෝ රාජ්‍ය සංස්ථාවකට යම් මුදලක් ගෙවිය යුතු හෝ 37 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන්දියක් ගෙවිය යුතු වන අවස්ථාවක සහ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින්, ඒ මුදල හෝ වන්දිය අධික හෝ අසාධාරණ බවට ක්‍රියාකරුවකු හබ කරන අවස්ථාවක එසේ හබයට විෂය වී ඇති කාරණය තීරණය කිරීම සඳහා බලධරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ බලධරයාගේ තීරණයකින් අතෘප්තියට පත්වන පාර්ශ්වයක් විසින් හබය, එක් පාර්ශ්වයක් විසින් එක් බේරුම්කරුවකු බැගින් පත් කළ යුතු බේරුම්කරුවන් දෙදෙනකු වෙත යොමු කරනු ලැබිය හැකි ය. එම බේරුම්කරුවන් විසින් බේරුම් කිරීම ආරම්භ කිරීමට පෙර තීරකයකු තෝරා ගත යුතු අතර, ඒ බේරුම්කරුවන් එකඟ වී ඇති අවස්ථාවක, ඒ බේරුම්කරුවන්ගේ තීරණය හෝ බේරුම්කරුවන් අතර එකඟත්වය නොමැති අවස්ථාවක තීරකගේ තීරණය අවසානාත්මක තීරණය වන්නේ ය.

විදුලි සංදේශ මාර්ගයක් හෝ කණුවක් ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නියම කිරීමට පළාත් පාලන ආයතනයකට හෝ රාජ්‍ය සංස්ථාවකට ඇති බලය.

36. පළාත් පාලන ආයතනයක් වෙත හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත සතුව ඇති හෝ ඒ ආයතනයේ හෝ සංස්ථාවේ පාලනය හෝ කළමනාකරණය යටතේ පවතින මේ දේපළක් උඩින්, ඔස්සේ, හරහා, ඇතුළතින් හෝ මතුපිට මේ පනතේ පෙරහුරුව වූ විධිවිධාන යටතේ ක්‍රියාකරුවකු විසින් විදුලි සංදේශ මාර්ගයක් හෝ කණුවක් ස්ථාපනය කර ඇත්තා වූ ද, ඒ විදුලි සංදේශ මාර්ගය හෝ කණුව එසේ ස්ථාපනය කරනු ලැබීමෙන් පසුව උද්ගත වී ඇති අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින් එය ඉවත් කිරීම හෝ එය ස්ථාපනය කර ඇති ස්ථානය වෙනස් කිරීම හෝ අත්‍යවශ්‍ය බව ඒ පළාත් පාලන ආයතනය හෝ රාජ්‍ය සංස්ථාව සලකන්නා වූ ද අවස්ථාවක, එය ඉවත් කරන ලෙස හෝ එය ස්ථාපනය කර ඇති ස්ථානය වෙනස් කරන ලෙස, අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ

රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ පාලනාධිකාරිය විසින් හෝ ඒ ක්‍රියාකරුගෙන් ඉල්ලා සිටිය හැකි අතර, ක්‍රියාකරු විසින්, 39 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ ඉල්ලීම ඉටු කළ යුතු ය.

ගෑස් හෝ ජල නළවල හෝ කාණුවල හෝ පිහිටීම වෙනස් කිරීමේ බලය.

37. (1) පළාත් පාලන ආයතනයක් වෙත හෝ රාජ්‍ය සංස්ථාවක් වෙත සතුව ඇති හෝ ඒ ආයතනයේ හෝ සංස්ථාවේ පාලනය හෝ කළමනාකරණය යටතේ පවතින යම් දේපළක් සම්බන්ධයෙන් මේ පනතින් ක්‍රියාකරුවකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ක්‍රියාකරු විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පළාත් පාලන ආයතනයේ හෝ රාජ්‍ය සංස්ථාවේ අවසර යට යටත්ව, ගෑස් හෝ ජලය සැපයීමේ (ප්‍රධාන නළයක් නොවන) යම් නළයක පිහිටීම හෝ විදුලි බලය සැපයීමේ යම් රැහැනක, කම්බියක හෝ කේබලයක පිහිටීම හෝ (ප්‍රධාන කාණුවක් නොවන) යම් කාණුවක පිහිටීම වෙනස් කළ හැකි ය.

(2) පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා හෝ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලනාධිකාරිය විසින්, එම බලතල ක්‍රියාත්මක කිරීමේදී ක්‍රියාකරු විසින් කරන ලද වැඩ අධීක්ෂණය කිරීම පිණිස, තැනැත්තකු යවනු ලැබිය හැකි අතර, එසේ එවනු ලැබූ තැනැත්තා සාධාරණව සෑහීමට පත් වන පරිදි ක්‍රියාකරු විසින් එම වැඩය ඉටු කළ යුතු ය. තව ද තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී යම් අලාභයක් සිදු වුවහොත් ඒ සඳහා ක්‍රියාකරු විසින් සාධාරණ වන්දියක් ගෙවිය යුතු ය.

ක්‍රියාකරු සහ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය සංස්ථාවක් අතර ඇතිවන ආරවුල්.

38. (1) (අ) 33 වන වගන්තියේ අනුරූ වගන්තියේ (iv) වන ඡේදයේ සඳහන් අවසරය දීම පළාත් පාලන ආයතනයක නගරාධිපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ රාජ්‍ය සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ පාලනාධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම හේතු කොට ගෙන; හෝ

(ආ) 37 වන වගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ කරන ලද ඉල්ලීමක් හේතුකොට ගෙන

ක්‍රියාකරු සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා හෝ රාජ්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ පාලනාධිකාරිය අතර ආරවුලක් ඇති වුව හොත්, ආරවුලට විෂය වී ඇති කාරණය ගැන තීරණයක් කිරීම සඳහා එය බලධරයා වෙත යොමු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ බලධරයා විසින් කරන ලද තීරණයෙන් අතෘප්තියට පත් ආරවුලේ පාර්ශ්වකරුවකු විසින් ඊට විරුද්ධව, ඒ තීරණය ඒ පාර්ශ්වකරුට දැනුම් දුන් දිනයෙන් පසු එක් මාසයක් ඇතුළත, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය. බලධරයාගේ තීරණය සම්බන්ධ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.



ක්‍රියාකරු විසින් නීත්‍යානුකූල බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිරෝධය පෑම යනාදිය.

39. 33 වන වගන්තිය යටතේ ක්‍රියාකරු වෙත හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, යම් තැනැත්තෙක් සාධාරණ හේතුවක් නොමැතිව ඒ ක්‍රියාකරුට හෝ තැනැත්තාට ප්‍රතිරෝධය පැවහොත් හෝ බාධා කළහොත් හෝ ප්‍රතිරෝධය පාන බවට හෝ බාධා කරන බවට තර්ජනය කළහොත් හෝ ප්‍රතිරෝධය පෑමට හෝ බාධා කිරීමට තැත් කළහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් කරන්නේ ය :

එසේ වුව ද අයිතිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් 33 වන වගන්තියේ (1) උපවගන්තියේ අනුරූ වගන්තියේ (i) ඡේදය යටතේ දිය යුතු ලිඛිත කැමැත්ත දීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් ම පමණක්, ඒ තැනැත්තා මේ උපවගන්තිය යටතේ වරදක් නොකරන්නේ ය.

විදුලි සංදේශ මාර්ගයක් හෝ කාණුවක් ඉවත් කරන ලෙස හෝ එහි පිහිටීම වෙනස් කරන ලෙස ඉල්ලීමට ඇති අයිතිය.

40. (1) මේ පනතේ විධිවිධාන යටතේ ක්‍රියාකරුවකු විසින් විදුලි සංදේශ මාර්ගයක් හෝ කාණුවක් යම් දේපළකට යටින්, උඩින්, ඔස්සේ, හරහා, ඇතුළතින් හෝ මත ස්ථාපනය කර ඇත්තා වූ ද, ඒ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තෙක්, එම විදුලි සංදේශ මාර්ගය හෝ කාණුව ඒ දේපළේ වෙනත් යම් කොටසකට හෝ ඒ දේපළේ ඉහළ හෝ පහළ මට්ටමකට හෝ ඉවත් කිරීමට හෝ එහි ස්වරූපය වෙනස් කිරීමට අවශ්‍ය වන හෝ එසේ කිරීම පහසුවක් වන අන්දමින් ඒ දේපළ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අදහස් කරන්නා වූ ද අවස්ථාවක, ඒ අනුව ඒ විදුලි සංදේශ මාර්ගය හෝ කාණුව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ඔහු විසින් ක්‍රියාකරුගෙන් ඉල්ලීමක් කළ හැකි ය :

එසේ වුව ද ඒ තැනැත්තාට 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අනුරූ වගන්තියේ (v) වන ඡේදය යටතේ වන්දි ගෙවා තිබේ නම් ඔහු එම ඉල්ලීම කරන විට, එසේ ඉවත් කිරීමේ හෝ වෙනස් කිරීමේ වියදම පියවීමට ප්‍රමාණවත් මුදලක් ඔහු විසින් ක්‍රියාකරුට දිය යුතු ය.

(2) සාධාරණ කාලසීමාවක් ඇතුළත ඒ ඉල්ලීම ඉටුකිරීම ක්‍රියාකරු විසින් පැහැර හැරියහොත් එම විදුලි සංදේශ මාර්ගය හෝ කාණුව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ක්‍රියාකරුට නියම කරන ලෙස ඉල්ලමින්, ඒ තැනැත්තා විසින් බලධරයා වෙත ලියවිල්ලකින් අභියාචනයක් කළ හැකි ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් අභියාචනයකින් පසුව ද, ඒ විදුලි සංදේශ මාර්ගය හෝ කාණුව ඉවත් කරවා ගැනීමට හෝ වෙනස් කරවා ගැනීමට ඉල්ලීම කරන තැනැත්තා අපොහොසත්ව සිටින අවස්ථාවක, ඒ විදුලි සංදේශ මාර්ගය හෝ කාණුව ඉවත් කරන ලෙසට හෝ වෙනස් කරන ලෙසට අණ දෙමින් කරන මෙන් ඒ දේපළ පිහිටා ඇති ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත ඔහු විසින් ලඝු කාර්ය පටිපාටිය අනුව ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලත් දිසා අධිකරණයක් විසින් ස්වකීය අභිමතය පරිදි, ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි ය; නැතහොත් ඒ විදුලි සංදේශ මාර්ගය හෝ කණුව ඒ දේපළේ වෙනත් යම් කොටසකට හෝ ඉහළ හෝ පහළ මට්ටමකට හෝ ඉවත් කරන ලෙස හෝ එහි ස්වරූපය වෙනස් කරන ලෙස කොන්දේසි රහිතව හෝ කොන්දේසිවලට යටත්ව ආඥාවක් ඒ අධිකරණය විසින් කළ හැකි ය.

විදුලි සංදේශ මාර්ගවලට හානි විය හැකි පරිදි ගස් හෝ පඳුරු රෝපණය කිරීම.

41. යම් නිශ්චල දේපළක් යටින්, උඩින්, ඔස්සේ හෝ හරහා විදුලි සංදේශ මාර්ගයක් ස්ථාපනය කර ඇති අවස්ථාවක, ඒ විදුලි සංදේශ මාර්ගය එසේ ස්ථාපනය කරනු ලැබූ දිනයට පසුව, ඒ විදුලි සංදේශ මාර්ගයට මතු දිනයක දී හානියක්, අවහිරයක් හෝ බාධාවක් විය හැකි යම් ගසක් හෝ පඳුරක් හෝ රෝපණය කරන කිසිම තැනැත්තෙක්, 33 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ ගස හෝ පඳුර හෝ එහි යම් ශාඛාවක් හෝ කපා දැමීමට සිදු වුවහොත් යම් වන්දියක් ලැබීමට හිමිකම් නොලබන්නේ ය.

මේ පනත ක්‍රියාත්මක වීමට පෙර ස්ථාපනය කරන ලද විදුලි සංදේශ මාර්ගවලට සහ කණුවලට බලපාන සේ මේ පනතේ විධිවිධාන ව්‍යාප්ත කිරීම.

42. ආණ්ඩුව විසින් පිහිටුවා, පවත්වා ගෙන යනු ලැබූ විදුලි සංදේශ කටයුතුවල කාර්ය සඳහා, මේ වගන්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව, යම් දේපළක් යටින්, උඩින්, ඔස්සේ, හරහා ඇතුළත හෝ මත ස්ථාපනය කරන ලද සෑම විදුලි සංදේශ මාර්ගයක් ම හෝ කණුවක් ම මේ පනතින් පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ මේ පනතේ සඳහන් සියලු නියමයන් පිළිපැදීමෙන් පසු ස්ථාපනය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

## VI වන කොටස

## වරදවල් සහ දණ්ඩන

වරදවල් සම්බන්ධයෙන් විභාග පැවැත්වීම.

43. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ යටතේ නියම කරන ලද යම් අවශ්‍යතාවක් හෝ කරන ලද යම් නියමයක්, ප්‍රදානයක් හෝ විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සියලු වරදවල් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක දී ලඝු ආකාරයෙන් විභාග කරනු ලැබිය හැකි ය.

19 වන වගන්තිය සහ 22 වන වගන්තිය යටතේ වරදවල්.

44. (1) 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 22 වන වගන්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසකට නොඅඩු හා රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු හා අවුරුදු තුනකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.



(2) 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙක් ම, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

පණිවුඩ අයථා සම්ප්‍රේෂණය හෝ ප්‍රතිග්‍රහණය සම්බන්ධ දණ්ඩනය.

45. මේ පනත උල්ලංඝනය වන පරිදි හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය වන පරිදි, විදුලි සංදේශ සේවයක් සපයනු ලබන බව විශ්වාස කිරීමට හේතු තිබියදී හෝ ඒ බව දැන දැනම—

(අ) ඒ විදුලි සංදේශ සේවය මගින් යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කරන හෝ ලබා ගන්නා; හෝ

(ආ) ඊට ආනුෂංගික යම් සේවාවක් ඉටු කරන; හෝ

(ඇ) ඒ විදුලි සංදේශ සේවාව මගින් සම්ප්‍රේෂණය කිරීම සඳහා යම් පණිවුඩයක් භාර දෙන; හෝ

(ඈ) එමගින් එවන ලද යම් පණිවුඩයක් භාර ගන්නා සෑම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, මාස තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

විදුලි සංදේශ සේවයක් වංචනිකව ප්‍රයෝජනයට ගැනීම.

46. ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවයකට අදාළ යම් ගාස්තුවක් ගෙවීමෙන් වැළකීමේ චේතනාවෙන් එම සේවය වංචා ලෙස ලබා ගන්නා හෝ ප්‍රයෝජනයට ගන්නා සෑම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

විදුලි සංදේශ ස්ථාපනයකට චේතනාන්විතව අලාභ කිරීම හෝ එය අනිසි ලෙස අතපෙළ ගැම සම්බන්ධ දණ්ඩනය.

47. (අ) යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීම හෝ භාරදීම වැළැක්වීමේ හෝ ඊට බාධා කිරීමේ චේතනාවෙන්; හෝ

(ආ) යම් පණිවුඩයකට අතරමගදී බාධා කිරීමේ හෝ එහි ඇතුළත් කරුණු දැන ගැනීමේ චේතනාවෙන්; හෝ

(ඇ) යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීමේ බලය තමන් සතු නැතිව, එය සම්ප්‍රේෂණය කිරීමේ චේතනාවෙන්; හෝ

(ඈ) අනර්ථයක් කිරීමේ හෝ වනසා දැමීමේ ක්‍රියාවක් කිරීමේ චේතනාවෙන්

යම් විදුලි සංදේශ ස්ථාපනයකට, මාර්ගයකට, කණුවකට හෝ යම් විදුලි සංදේශ සේවා ක්‍රමයක කොටසක් වන හෝ එය ක්‍රියාකර වීමෙහි ලා භාවිත කරනු ලබන වෙනත් කුමර වූ හෝ දෙයකට අලාභ කරන, එය ඉවත් කරන හෝ අනිසි ලෙස අතපත ගාන සෑම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

විදුලි සංදේශ නිලධරයන්ට සහ වෙනත් අයට අසත්‍ය හෝ ගොතන ලද පණිවුඩ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

48. අසත්‍ය බව හෝ ගොතන ලද්දක් බව තමා දන්නා යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කරන හෝ සම්ප්‍රේෂණය කිරීමට සලස්වන හෝ විදුලි සංදේශ සේවය මගින් සම්ප්‍රේෂණය කිරීම සඳහා හෝ භාරදීම සඳහා යම් විදුලි සංදේශ නිලධරයකුට හෝ විදුලි සංදේශ සේවයක් හා සම්බන්ධ නිල කාර්ය භාරව සිටින යම් තැනැත්තකුට හෝ ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කිරීමට සලස්වන සෑම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය. යම් පණිවුඩයක් අසත්‍ය හෝ ගොතන ලද පණිවුඩයක් බව තමා දැන නොසිටි බැව් ඔප්පු කිරීමේ භාරය මේ වගන්තිය යටතේ චෝදනා කරනු ලැබූ තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

විදුලි සංදේශ නිලධරයන් අතින් විසින් කරනු ලබන වරදවල්.

49. (අ) සම්ප්‍රේෂණය සඳහා හෝ භාරදීම සඳහා තමා වෙත ලැබී ඇති යම් පණිවුඩයක් හිතාමතා ම විනාශ කරන, සඟවන, වෙනස් කරන හෝ තමාගේ කාර්ය ඉටු කිරීමෙහිලා හැර අන්‍යාකාරයකින් චේතනාන්විතව ඒ පණිවුඩයේ අඩංගු කරුණු පූර්ණ වශයෙන් වෙනස් කරන හෝ ඒ කරුණු සම්බන්ධයෙන් අනුචිත ලෙස මැදිහත් ව ක්‍රියා කරන; හෝ

(ආ) හිතාමතාම සහ මේ පනත යටතේ තත් කාර්යය සඳහා බලය දී ඇති බලධරයකුට අවනත වීමේ වශයෙන් හැර, යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය නොකරන හෝ අතර මගදී නවත්වන හෝ රඳවා තබන; හෝ

(ඇ) තමාගේ නිල කාර්යය ප්‍රකාර හෝ අධිකරණ විධානයක් පරිදි හැර, යම් පණිවුඩයක ඇතුළත් කරුණු හෝ ඇතුළත් කරුණුවලින් යම් කොටසක්, ඒ පණිවුඩය ලැබිය යුතු තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් කරන

සෑම විදුලි සංදේශ නිලධරයෙක් ම හෝ විදුලි සංදේශ සේවාවක් හා සම්බන්ධ නිල කාර්ය භාරය සිටින යම් තැනැත්තෙක් ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.



විදුලි සංදේශ කාර්යාලයකට හෝ පරිශ්‍රයකට අනවසරයෙන් ඇතුළුවීම හෝ විදුලි සංදේශ නිලධරයන්ට අවහිර කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

50. (අ) විදුලි සංදේශ කාර්යාලයකට ඒ ස්ථානය භාර විදුලි සංදේශ නිලධරයාගේ අවසරය නොමැතිව ඇතුළුවන; හෝ

(ආ) විදුලි සංදේශ කාර්යාලයක් වටා බැඳි වැටකින් සැදුනු කොටුවකට ඇතුළුවීම තහනම් කෙරෙන යම් නියෝගයක් හෝ දැන්වීමක් උල්ලංඝනය කරමින්, ඊට ඇතුළුවන; හෝ

(ඇ) ඒ කාර්යාලයේ හෝ කොටුවෙහි සේවයේ නියුක්ත යම් නිලධරයකු හෝ සේවකයකු විසින්, ඉන් ඉවත් වන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට එසේ ඉවත් වීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඈ) එවැනි යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ කාර්ය ඉටු කිරීමේ දී හිතාමතා ඔහුට බාධා කරන හෝ අවහිර කරන

සෑම තැනැත්තෙක් ම ඉන් මේ පනත යටතේ වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, මාස තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

පණිවුඩයක ඇතුළත් කරුණු දැනගැනීමේ චේතනාවෙන් අයුතු ඇතුළුවීම ආදිය සම්බන්ධ දණ්ඩනය.

51. යම් පණිවුඩයකට ඇතුළත් කරුණු නීති විරෝධී ලෙස දැන ගැනීමේ චේතනාවෙන් හෝ මේ පනත යටතේ දඬුවම් ලැබිය යුතු යම් වරදක් කිරීමේ චේතනාවෙන්, 51 වන වගන්තියෙහි සඳහන් ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, 50 වන වගන්තියේ නියමිත දඩයට අතිරේකව, මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

පණිවුඩයක ඇතුළත් කරුණු යනාදිය දැන ගැනීම සම්බන්ධ දණ්ඩනය.

52. (අ) ඉලෙක්ට්‍රෝන මගින් හෝ වෙනත් ක්‍රමයකින් පණිවුඩයක ඇතුළත් කරුණු හෝ එහි ව්‍යවහාර තොරතුරු දැන ගැනීමට; හෝ

(ආ) යම් පණිවුඩයකට හෝ එහි ව්‍යවහාර තොරතුරුවලට අයුතු ලෙස මැදිහත් වීමේ චේතනාවෙන්; හෝ

(ඇ) යම් පණිවුඩයක හෝ එහි ව්‍යවහාර තොරතුරු නීති විරෝධී ලෙස දැන ගැනීමේ චේතනාවෙන්; හෝ

(ඈ) මේ පනත යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කිරීමේ චේතනාවෙන්

නීත්‍යානුකූල බලයක් නොමැතිව ක්‍රියා කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිදහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

මේ වගන්තියේ සහ 54 වන වගන්තියේ කාර්ය සඳහා "ව්‍යවහාර තොරතුරු" යන්නෙන්, අමතන පාරිභෝගිකයාගේ සහ අමතනු ලබන පාරිභෝගිකයාගේ අනන්‍යතාව, පණිවුඩය ආරම්භ කරන දිනය සහ වේලාව සහ පණිවුඩයේ වර්ගය පිළිබඳ තොරතුරු අදහස් වේ.

විදුලි සංදේශ සම්ප්‍රේෂණයක් සිතා මතා අතරමඟ නැවැත්වීම.

53. පොදු ප්‍රතිග්‍රහණය සඳහා නොවන යම් විදුලි සංදේශ සම්ප්‍රේෂණයක් අතරමග නවත්වා, එහි ඇතුළත් කරුණු අනිසි ලෙස දැන ගැනීමට තැත් කරන හැම තැනැත්තෙක් ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

විදුලි සංදේශ නිලධරයන් විසින් පණිවුඩ අතරමඟ නැවැත්වීම සහ එහි ඇතුළත් කරුණු හෙළිදරව් කිරීම.

54. (1) තමාගේ නිල කාර්යය කර ගෙන යනු අතරතුර හැර—

(අ) විදුලි සංදේශ ක්‍රමයක් මගින් යවනු ලබන පණිවුඩයක් හෝ එහි ව්‍යවහාර තොරතුරු චේතනාන්විතව අතරමග නවත්වන; හෝ

(ආ) ඒ ක්‍රමය මගින් යවන ලද පණිවුඩයක් චේතනාන්විතව අතරමග නවත්වා, ඒ පණිවුඩයේ ඇතුළත් කරුණු වෙනත් තැනැත්තකුට හෙළිදරව් කරන,

සෑම විදුලි සංදේශ නිලධරයෙක් ම හෝ විදුලි සංදේශ ක්‍රමයක් හා සම්බන්ධ නිල කාර්ය භාරව සිටින යම් තැනැත්තෙක් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඉන් වරදක් කරන්නේ ය.

(2) යම් තැනැත්තකු සඳහා විදුලි සංදේශ ක්‍රමයක් මගින් සපයන ලද විදුලි සංදේශ සේවා දැක්වෙන යම් ගිණුම් ප්‍රකාශයක ඇතුළත් කරුණු වෙනත් යම් තැනැත්තකුට, තමාගේ නිල කාර්ය කර ගෙන යාමේ දී හැර, චේතනාන්විතව හෙළිදරව් කරන සෑම විදුලි සංදේශ නිලධරයෙක් ම හෝ විදුලි සංදේශ ක්‍රමයක් මෙහෙයීම හා සම්බන්ධ නිල කාර්ය භාරව සිටින යම් තැනැත්තෙක්, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වරදක් කරන්නේ ය.

(3) මේ පනත යටතේ අමාත්‍යවරයාගේ අත්සනින් දෙන ලද විධානයකට අවනතව කරන ලද කිසිවකට (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවන අතර, ඒ උපවගන්තියේ (ආ) ඡේදය සහ (2) වන උපවගන්තිය යම් අපරාධ වරදක් පිළිබඳ විමර්ශනයක් සම්බන්ධයෙන් හෝ යම් අපරාධ නඩු කටයුත්තක කාර්ය සඳහා හෝ කරනු ලබන යම් හෙළිදරව් කිරීමකට අදාළ නොවන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ වරදක් කරන සෑම නිලධරයෙක් ම සහ තැනැත්තෙක් ම, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් වන්නේ ය.



විදුලි සංදේශ මාර්ග යනාදියට කිසිවක් සවි කිරීම සම්බන්ධ දණ්ඩනය.

55. නීත්‍යනුකූල බලය නොමැතිව, විදුලි සංදේශ කණුවකට නාගින හෝ විදුලි සංදේශ මාර්ගයකට, කණුවකට හෝ වෙනත් උප කරණයකට යම් දෙයක් සවි කරන සෑම තැනැත්තෙක්ම ඉන් වර දක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

මුදල් නොගෙවූ පණිවුඩ සම්ප්‍රේෂණය නාහනම් බව.

56. බලධරයා විසින් නියම කර ඇති ගාස්තුව ගෙවනු නොලැබ, යම් පණිවුඩයක් විදුලි සංදේශ සේවය මාර්ගයෙන් සම්ප්‍රේෂණය කරන හෝ සම්ප්‍රේෂණය කිරීමට සලස්වන හෝ භාර දෙන හෝ භාරදීමට සලස්වන සෑම විදුලි සංදේශ නිලධරයෙක්ම හෝ විදුලි සංදේශ කාර්යාලයක් ලෙස පාවිච්චි කරනු ලබන යම් කාර්යාලයකට සම්බන්ධ නිල කාර්යයේ යෙදී ඇති සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

විදුලි සංදේශ නිලධරයකුගේ විෂමාචාරය සම්බන්ධ දණ්ඩනය.

57. බීමත්කම, වෛද්‍යවරයකු විසින් නියම කරනු නොලැබූ මත් ද්‍රව්‍යයක බලපෑම යටතේ සිටීම හෝ නොසැලකිලිමත්කම සම්බන්ධයෙන් හෝ යම් පණිවුඩයක් නිවැරදිව සම්ප්‍රේෂණය කිරීම හෝ භාරදීම අවහිර කෙරෙන හෝ ප්‍රමාද කෙරෙන වෙනත් විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරු වන සෑම විදුලි සංදේශ නිලධරයෙක්ම හෝ විදුලි සංදේශ සේවයක් හා සම්බන්ධයෙන් නිල කාර්යයයේ යෙදී ඇති වෙනත් සෑම තැනැත්තෙක්ම සහ යම් පණිවුඩයක් සම්ප්‍රේෂණය කිරීම හෝ භාර දීම ප්‍රමාද කිරීම හෝ පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරු වන ඒ සෑම නිලධරයකුම රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ මාසතුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

අසභ්‍ය හෝ අශිෂ්ට හෝ කැරලිකාර පණිවුඩයක් ඉදිරිපත් කිරීම සම්බන්ධ දණ්ඩනය.

58. යම් අශිෂ්ට, අසභ්‍ය, කැරලිකාර, අශ්ලීල, තර්ජනාත්මක හෝ අතිශයින් අප්‍රසන්න ස්වභාවයක පණිවුඩයක් යම් විදුලි සංදේශ කාර්යාලයක දී සම්ප්‍රේෂණය කිරීම සඳහා තමා විසින්ම හෝ තම නියෝජිතයකු හෝ සේවකයකු මගින් ඉදිරිපත් කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

දුරකථන ඇමතුම් මඟින් පීඩා කිරීම සම්බන්ධ දණ්ඩනය.

59. (1) යම් විදුලි සංදේශ නිලධරයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට පීඩාවක් හෝ හිරිහැරයක් සිදු කිරීම පිණිස සාධාරණ හේතුවක් නොමැතිව නිරන්තරයෙන් දුරකථන ඇමතුම් කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර

හරිනු ලැබුවහොත්, මාස තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් වන්නේ ය.

(2) විදුලි සංදේශ නිලධරයකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් වර්ගයේ ඇමතුමකට අවහිර කිරීම, එය සොයා ගැනීම, සාරිනය කිරීම හෝ සටහන් කර ගැනීම හෝ එවැනි ඇමතුමක් කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම හෝ නීත්‍යානුකූල වන්නේ ය.

(3) වෙනත් තැනැත්තන් දෙදෙනෙකු අතර කෙරෙන දුරකථන කථාවකට නීති විරෝධීව හා සිතාමතාම සවන් දෙන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

වැරදීමකින් භාර දෙන ලද පණිවුඩයක් ළඟ තබා ගැනීම සම්බන්ධ දණ්ඩනය.

60. වෙනත් යම් තැනැත්තකු වෙත භාර දිය යුතුව තිබුණු පණිවුඩයක් වංචනිකව ළඟ තබා ගන්නා හෝ සිතාමතා සඟවා තබන හෝ නැති කරන හෝ රඳවා තබන හෝ එවැනි යම් පණිවුඩයක් භාර දෙන ලෙස විදුලි සංදේශ නිලධරයකු විසින් නියම කරනු ලැබූ විට එසේ කිරීම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තෙක්ම ඉන් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

විදුලි සංදේශ කම්බි හා සම්බන්ධ වරදවල්.

61. (1) විදුලි සංදේශ කම්බි තමා සන්තකයේ, භාරයේ හෝ තමාගේ පාලනය යටතේ ඇත්තා වූ සහ ඒ කම්බිය නීත්‍යානුකූලව අත් කර ගන්නා ලද කම්බි බව සනාථ කිරීමට අපොහොසත් වන්නා වූ කවර හෝ තැනැත්තෙක් ඉන් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "විදුලි සංදේශ කම්බි" යන්නෙන් විදුලි සංදේශ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන සියලු ලෝහමය හෝ අලෝහමය සන්නායක අදහස් වේ.

(2) ප්‍රස්තුත විදුලි සංදේශ කම්බි (1) වන උපවගන්තියේ විස්තර කර ඇති කම්බි බවට සහතික කරන සහ බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකුගේ අත්සනින් යුක්ත බවට



අදහස් කෙරෙන සහතිකයක් අධිකරණයක දී පිළිගත හැකි වන්නේ ය. තව ද එය එහි කර ඇති ප්‍රකාශවල සත්‍යතාව සනාථ කරන මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක්—

(අ) කිරීමට තැත් කරන හෝ කිරීමට සූදානම්වීමක් වශයෙන් යම් ක්‍රියාවක් කරන; හෝ

(ආ) කිරීමට වෙනත් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ඇ) කිරීමේලා වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන තැනැත්තෙක් ද ඒ වරද කරන අතර වරදකරු කරනු ලැබූ විට, (1) වන උපවගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු සඳහා දක්වා ඇති දණ්ඩනයටම යටත් වන්නේ ය.

වරදවල් කිරීමට තැත් කිරීම සම්බන්ධ දණ්ඩනය.

62. මේ පනත යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් කිරීමට තැත් කරන කවරකු වුව ද වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සඳහා මෙහි විධිවිධාන සලසා ඇති දඬුවමම ලැබීමට යටත් වන්නේ ය.

පොදු දණ්ඩන.

63. මේ පනත යටතේ යම් වරදක් සඳහා විශේෂයෙන් දණ්ඩනයක් නියම කරමින් විධිවිධාන සලසා නොමැති අවස්ථාවක ඒ වරද කරන සෑම තැනැත්තෙක් ම, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට සහ ඒ දඩය ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, මාස තුනකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් වන්නේ ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වරදවල්.

64. යම් පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ රීති යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද කරන ලද වේලාවේ දී, ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරිව, ලේකම්ව හෝ ඒ සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, ඒ වරද කරන ලද වේලාවේ දී ඒ මණ්ඩලයේ සභාපතිව, කළමනාකරුව, ලේකම්ව හෝ ඒ සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම

ඒ වරද තමාගේ දැනීම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා හැකි සියලු උද්‍යෝගයෙන් කටයුතු කළ බව හෝ ඔහු ඔප්පු කළහොත් මිස, ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවලදී මහේස්ත්‍රාත්වරයකු විසින් සෝදිසි වරෙන්තු නිකුත් කිරීම.

65. (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක විධිවිධාන උල්ලංඝනය කරමින්, තම අධිකරණ බල සීමාව ඇතුළත යම් ස්ථානයක හෝ වාහනයක හෝ නැවක හෝ ගුවන් යානයක යම් විදුලි සංදේශ උපකරණයක් ස්ථාපනය කර හෝ පිහිටුවා ඇති බව හෝ පවත්වා ගෙන යනු ලබන හෝ ක්‍රියා කරවනු ලබන බව හෝ යම් විදුලි සංදේශ උපකරණයක් ආනයනය කර ඇති බව, විකුණා ඇති බව හෝ විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට මහේස්ත්‍රාත්වරයකු, දිවුරුම් පිට ලැබී ඇති තොරතුරු අනුව, සෑහීමට පත් වුවහොත්, ඒ ස්ථානයට, වාහනයට, නැවට හෝ ගුවන් යානයට ඇතුළු වී එය සෝදිසි කිරීමටත්, යම් විදුලි සංදේශ කාර්යයක් සඳහා පාවිච්චි කරන බවට හෝ පාවිච්චි කිරීමට අදහස් කරන බවට පෙනී යන සහ ඉහත කී කාර්ය සඳහා ආනයනය කරන ලද, විකුණන ලද හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන ලද බව පෙනී යන යම් උපකරණයක් තහනමට ගැනීමටත් බලය දෙමින් සෝදිසි වරෙන්තුවක් ඒ මහේස්ත්‍රාත්වරයා විසින් යම් පොලිස් නිලධරයකුට නිකුත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තහනමට ගන්නා ලද විදුලි සංදේශ උපකරණයක්, ඒ උපකරණයේ අයිතිකරු හෝ එහි පාලනය දරන වෙනත් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ විට, මහේස්ත්‍රාත්වරයාගේ ආඥාවක් පිට, රජය සතු වන්නේ ය.

## VII වන කොටස

## සාමාන්‍ය කරුණු

සාමාන්‍ය හෝ විශේෂ විධාන කිරීමට අමාත්‍යවරයා සතු බලය.

66. (1) අමාත්‍යවරයා විසින් කලින් කල බලධරයා වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලක් මගින් නිකුත් කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ විධානයක් අනුව ක්‍රියා කිරීමද යම් ක්‍රියාකරුවකු ඒවා අනුව ක්‍රියා කරන බවට වග බලා ගැනීම ද බලධරයාගේ කාර්යය වන්නේ ය.

අමාත්‍යවරයා විසින් කරනු ලබන සාමාන්‍ය විධාන.

67. අමාත්‍යවරයාගේ නිල කාර්ය සඳහා අවශ්‍ය වන තොරතුරු ලියවිල්ලක් මගින් තමාට සපයන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල බලධරයාට විධාන කළ හැකි ය.

රීති සෑදීමට බලධරයාට ඇති බලය.

68. (1) මේ පනත යටතේ යම් කරුණු සම්බන්ධයෙන් රීති සෑදීමට නියම කර හෝ බලය දී ඇති විටක ඒ කරුණු සම්බන්ධයෙන් බලධරයා විසින් රීති සෑදිය හැකි ය.

(2) බලධරයා විසින් සාදනු ලබන සියලු රීති ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒවා පළ කරනු ලබන දිනයේ දී හෝ එහි සඳහන් කරනු ලබන ඊට පසු දිනයක දී හෝ ඒවා ක්‍රියාත්මක වන්නේ ය.



(3) බලධරයා විසින් සාදන ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු, ක්‍රියාත්මක නොවන්නේ ය.

විදුලි සංදේශ සේවය පාවිච්චි කිරීම තහනම් කිරීමට හෝ සීමා කිරීමට ආණ්ඩුවට ඇති බලය.

69. මහජන හදිසි තත්ත්වයක් ඇති වූ විටක හෝ මහජන ආරක්ෂාව සහ සාමකාමීභාවය ඇති කිරීම පිණිස, විදුලි සංදේශ මගින් පණිවුඩ සම්ප්‍රේෂණය කිරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම තහනම් කිරීම හෝ අධීක්ෂණයට හා පාලනයට යටත් කිරීම යෝග්‍ය යයි හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත්, ඔහු විසින්, පොදුවේ බලපවත්වන පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් හෝ ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය ඇතුළත ඇති යම් නැවක හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයට ඉහලින් ඇති යම් වාහනයක හෝ ගුවන් යානයක සපයා ඇති යම් විදුලි සංදේශ සේවයක් සම්බන්ධයෙන් විශේෂයෙන් ලියවිල්ලක් මගින් කරනු ලබන නියමයක් මගින්—

(අ) තහනම් කිරීම යෝග්‍ය වන හෝ අවශ්‍ය වන අවස්ථාවක, පොදුවේ හෝ යම් නිශ්චිත ස්ථානයක හෝ මධ්‍යස්ථානයක හෝ යම් නිශ්චිත නැවක, වාහනයක හෝ ගුවන් යානයක හෝ යම් නිශ්චිත විදුලි සංදේශ විශේෂයක් මගින් හෝ ක්‍රියාකරුවකු විසින් හෝ නිශ්චිත තැනැත්තකු විසින් හෝ නිශ්චිත පන්තියකට අයත් තැනැත්තන් විසින් හෝ විදුලි සංදේශ මගින් පණිවුඩ සම්ප්‍රේෂණය කිරීම හෝ ප්‍රතිග්‍රහණය කිරීම තහනම් කළ හැකි ය; නැතහොත්

(ආ) අධීක්ෂණය හා පාලනය යෝග්‍ය වන හෝ අවශ්‍ය වන අවස්ථාවක—

(i) පොදුවේ හෝ ක්‍රියාකරුවකු විසින් නැතහොත් යම් නිශ්චිත විදුලි සංදේශ සේවයක් භාරව සිටින තැනැත්තකු විසින් විදුලි සංදේශ මගින් පණිවුඩ සම්ප්‍රේෂණය කළ හැක්කේ හෝ ප්‍රතිග්‍රහණය කළ හැක්කේ යම් කොන්දේසිවලට සහ සීමාකිරීම්වලට යටත්ව ද ඒවා නියම කළ හැකි ය; තව ද

(ii) විදුලි සංදේශ මගින් සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ විදුලි සංදේශ මගින් සම්ප්‍රේෂණය කරනු ලබන හෝ ප්‍රතිග්‍රහණය කරනු ලබන සියලු පණිවුඩ හෝ යම් නිශ්චිත පංතියකට අයත් හෝ නිශ්චිත වර්ගයක පණිවුඩ අතරමග දී නැවැත්වීම සඳහා හෝ සමීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු සලකන විධිවිධාන සැලැස්විය හැකි ය.

මේ පනත යටතේ හෝ බලධරයාගේ විධානය අනුව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ආරක්ෂාව.

70. (අ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ බලධරයා විසින් සද්භාවයෙන් කරන ලද හෝ එසේ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් බලධරයාට විරුද්ධව; හෝ

(ආ) බලධරයාගේ යම් නිලධරයකු සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් හෝ නීතියක් යටතේ හෝ බලධරයාගේ විධානය අනුව හෝ සද්භාවයෙන් කරන ලද හෝ එසේ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු ලැබිය නොහැකි ය.

නියෝග. 71. (1) නියෝග සෑදිය යුතු කරුණක් ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබ ඇති හෝ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් ප්‍රදාන ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින්—

(අ) 5 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ ආණ්ඩුව විසින් දෙනු ලබන යම් පොදු හෝ විශේෂ විධිවිධාන අනුව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රමවත් කිරීමේ පියවරවල් ;

(ආ) 17 වන වගන්තියේ සඳහන් බලපත්‍රය හැර, මේ පනතේ සඳහන් එක් එක් බලපත්‍ර සම්බන්ධයෙන් බලපත්‍රයේ ආකෘතිය, බලපත්‍රය සඳහා ඉල්ලීම් කළයුතු ආකාරය, බල පත්‍රය වලංගු වන කාලසීමාව, බලපත්‍රය නිකුත් කිරීම සඳහා සහ බලපත්‍රය අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව ;

(ඇ) 6 වන වගන්තිය යටතේ පැවැත්විය යුතු තාක්ෂණික පරීක්ෂණ සහ අපේක්ෂකයන්ගෙන් අය කළ යුතු ගාස්තු සහ ඒ පරීක්ෂණ වල දී නියමිත ප්‍රවීණතා මට්ටම්වලට පැමිණෙන අපේක්ෂකයන්ට නිකුත් කළ යුතු සහතිකයේ ආකෘතිය ;

(ඈ) පණිවුඩ සම්ප්‍රේෂණය කළ යුත්තේ කවර ආකාරයකින් ද, කවර කොන්දේසි සහ සීමා කිරීම්වලට යටත්ව ද යන වග ;

(ඉ) පණිවුඩ අතරමග නැවැත්වීම හෝ හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ගත යුතු පූර්වෝපක්‍රම ;

(ඊ) යම් විදුලි සංදේශ නිලධරයකුගේ භාරයේ ඇති පණිවුඩ සෙවීම සඳහා සහ පණිවුඩවල සහතික පිටපත් සැපයීම සඳහා සහ වෙනත් යම් ලේඛනවල සහතික පිටපතක් සැපයීම සඳහා අය කළ යුතු ගාස්තු ;

(උ) 69 වන වගන්තිය යටතේ යම් නියමයක් බලාත්මකව නොපවතින යම් වේලාවක, ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක විදුලි සංදේශ උපකරණයක් ක්‍රියාත්මක කිරීම හෝ පාවිච්චි කිරීම විධිමත් කිරීම ;



(ඌ) 69 වන වගන්තිය යටතේ යම් නියමයක් බලාත්මකව නොපවතින යම් වේලාවක—

(i) ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය ඇතුළත තිබෙන, ශ්‍රී ලංකාවට අයත් හෝ පිටරටකට අයත් යම් නැවක ; හෝ

(ii) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවට උඩින් හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය උඩින් තිබෙන, ශ්‍රී ලංකාවට අයත් හෝ පිටරටකට අයත් යම් ගුවන් යානයක

ඇති යම් විදුලි සංදේශ උපකරණයක් ක්‍රියාත්මක කිරීම හෝ පාවිච්චි කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

(එ) යම් නිශ්චිත පන්තියක හෝ වර්ගයකට අයත් පණිවුඩවල රහස්‍ය භාවය සහතික කිරීම

නියම කරමින් නියෝග සෑදිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ සඳහන් වන යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, ඒ යටතේ එතෙක් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් එසේ යම් දිනයක සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන විට, ඒ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

72. (1) (192 වන අධිකාරය වූ) විදුලි සංදේශ ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ. 192 වන අධිකාරය ඉවත් කිරීම සහ ශේෂ කිරීම.

(2) ඉහත කී ආඥාපනත ඉවත් කරනු ලැබුව ද,

(අ) විදුලි සංදේශ බලධරයා විසින් හෝ විදුලි සංදේශ බලධරයාට විරුද්ධව හෝ මුල් අවස්ථා අධිකරණයක හෝ අභියාචනාධිකරණයක හෝ ඉවත් කරන ලද ආඥාපනත යටතේ පවරනු ලැබ, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී, අවසන් නොවී පවතින සෑම නඩුවක් ම හෝ නඩු කටයුත්තක් ම සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව පවරනු ලැබූ නඩුවක් හෝ නඩු කටයුත්තක් ලෙස සැලකිය යුතු අතර, ඒ සෑම නඩුවක් ම හෝ නඩු කටයුත්තක් ම සම්බන්ධයෙන් අවසානය තෙක් කටයුතු කරගෙන ගොස්, ඒ අනුව තීන්දුව ක්‍රියාත්මක කළ හැකි ය.

(ආ) ඉවත් කරන ලද ආඥාපනත යටතේ සාදනු ලැබ, මේ වගන්තිය ක්‍රියාත්මකවන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක් ම හෝ රීතියක් ම, ඒ නියෝගය හෝ රීතිය මේ පනතේ විධිවිධාන වලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදන ලද නියෝගයක් හෝ රීතියක් ලෙස සැලකිය යුතු අතර මේ පනත යටතේ සාදනු ලබන නියෝග හෝ රීති මගින් සංශෝධනය හෝ පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය;

(ඇ) මේ පනත යටතේ බලපත්‍රයක් අවශ්‍ය නොවන කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍ර හැර ඉවත් කරන ලද ආඥාපනතේ විධිවිධාන යටතේ, විදුලි සංදේශ බලධරයා වෙත, මේ වගන්තිය ක්‍රියාත්මක වනු දිනයට පෙර, නියමිත වර්ගයක බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කරනු ලැබ, ඒ දිනයේ ද සැලකිල්ලට භාජනව පවතින සෑම ඉල්ලුම් පත්‍රයක් ම, මේ පනත යටතේ බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලුම් පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රවලට අදාළ වන මේ පනතේ විධිවිධාන යටතේ බලධරයා විසින් ඒ ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය.

(ඈ) ඉවත් කරනු ලද ආඥාපනතේ 3 වන සහ 4 වන වගන්ති යටතේ විදුලි සංදේශ බලධරයා විසින් මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම නිකුත් කරනු ලැබ බලාත්මකව පවතින සෑම බලපත්‍රයක් ම, මේ පනතේ විධිවිධාන යටතේ බලධරයා විසින් දෙන ලද බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) යම් නඩුවක දී, කාරණයක දී, නඩු කටයුත්තක දී හෝ ලේඛනයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ විසින් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ වාසියට හෝ ඊට විරුද්ධව හෝ සටහන් කරන ලද හෝ කරන ලද යම් තීන්දු ප්‍රකාශයක්, ආඥාවක්, නියමයක් හෝ ප්‍රදානයක් මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපවත්වන පරිදි, සංස්ථාවේ වාසියට හෝ සංස්ථාවට විරුද්ධව සටහන් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක්, නියමයක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ක්‍රියාත්මක කළ හැකි වන්නේ ය.

33 අර්ථ නිරූපණය.

33. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතේ—

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, තාක්කාලයේ විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් ධුරය දරන තැනැත්තා අදහස් වේ;



"කණුව" යන්නෙන්, විදුලි සංදේශ මාර්ගයක් උසුලා සිටීම, එල්ලා තැබීම හෝ දරා සිටීම සඳහා වූ කණුවක්, රිටක්, බැකට්ටුවක්, ධාරකයක්, රැඳවුමක්, කරුවක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ;

"ක්‍රියාකරු" යන්නෙන්, විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියා කරවීම සඳහා 17 වන වගන්තිය යටතේ බලපත්‍රයක් මගින් බලය සඳනු ලැබ ඇති තැනැත්තෙකු අදහස් වේ;

"ගුවන් විදුලි ධාරාව" යන්නෙන්, අවශ්‍ය දුරස්ථ තැනක සිට විකිරණ මගින් නිපදවන සංඥා ශක්තිය වැඩි කිරීමට ඇන්ටෙනා ප්‍රයෝජනයට ගෙන බලය යොමු කරන විද්‍යුත් විකිරණයක් අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග වලින් නියමිත බව අදහස් වේ;

"පණිවුඩය" යන්නෙන්, විදුලි සංදේශ මගින් යවන ලද හෝ ලබා ගන්නා ලද හෝ කරන ලද නැතහොත් විදුලි සංදේශ මගින් යැවීම සඳහා හෝ භාර දෙනු ලැබීම සඳහා විදුලි සංදේශ නිලධරයකුට දෙන ලද යම් නිවේදනයක් අදහස් වන අතර, ඊට සංගීතය, සාකච්ඡා, කථා, දේශන, වෛදික රූගුම්, ලියවිලි, ප්‍රතිරූප, ප්‍රතිමූර්ති හෝ පින්තූර විකාශනය සඳහා හෝ යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ක්‍රියා කිරීම සඳහා හෝ පාලනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් සංඥාවක් හෝ සංඥා සංකලනයක් ඇතුළත් වේ;

"පර්යන්ත උපකරණ" යන්නෙන්, අදාළ උපක්‍රමයට කෙළින් ම සම්බන්ධ වී සිටින හෝ ස්විච්ගත පද්ධතියක් මගින් ඊට සම්බන්ධ වී සිටින අන්තිම භාවිතයාගේ ප්‍රයෝජනය සඳහා, මූර්ජිත සංඥාවක් එහි ආරම්භක සංඥා ආකෘතියට පරිවර්තනය කරන හෝ සංඥා එහි ආරම්භක තත්ත්වයෙන් කෙළින් ම ප්‍රතිග්‍රහණය කරන උපක්‍රමයක් අදහස් වේ;

"පොදු ස්විච්ගත පද්ධතිය" යන්නෙන් මේ පනත යටතේ වූ බලපත්‍රයකින් දෙන ලද බලය යටතේ ක්‍රියාකරුවකු විසින් ශ්‍රී ලංකාවේ ජනතාවට විදුලි සංදේශ සේවා සැපයීම පිණිස උපයෝගී කර ගත හැකි, සම්බන්ධයකට සන්ධි සංයෝග කිරීම මගින් අදාළ බූවවල ස්විච්ගත සම්බන්ධක ප්‍රයෝජනයට ගෙන, නිශ්චිත ලක්ෂ්‍ය දෙකක් අතර හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර විදුලි සංදේශ සැපයීම පිණිස සම්බන්ධක යන් සපයන ධ්‍රැව සහ සන්ධි කට්ටලයන් ජාලයක් අදහස් වේ;

"විදුලි සංදේශය" යන්නෙන්, දෘශ්‍ය හෝ කම්බි හෝ ගුවන් විදුලි තරංග හෝ වෙනත් යම් විද්‍යුත් චුම්භක ක්‍රමයක් මගින් සලකුණු, සංඥා, ලියවිලි, ප්‍රතිමූර්ති, ශබ්ද හෝ කවර හෝ ස්වභාවයක දැනුම්දීමක් සම්ප්‍රේෂණ කිරීම, නිකුත් කිරීම හෝ ප්‍රතිග්‍රහණය කිරීම අදහස් වේ;

"විදුලි සංදේශ අධ්‍යක්ෂවරයා" යන්නෙහි, (192 වන අධිකාරය වූ) විදුලි සංදේශ ආඥාපනතේ දී ඇති අර්ථය ඇත්තේ ය;

"විදුලි සංදේශ උපකරණ" යන්නෙන්—

(අ) විදුලි සංදේශ ක්‍රමයක් මඟින් ගෙන යෑමට ඇති හෝ ගෙන ගොස් තිබෙන "විදුලි සංදේශ ක්‍රමය" යන්නෙහි අර්ථ කථනය යටතේ වූ කවර හෝ දෙයක් සම්ප්‍රේෂණය කිරීමෙහි ලා හෝ ප්‍රතිග්‍රහණය කිරීමෙහි ලා සම්බන්ධ කිරීමට තනනු ලැබූ හෝ උපයෝගී කර ගනු ලැබූ උපකරණයක්; හෝ

(ආ) එවැනි යම් ක්‍රමයක කාර්ය සඳහා, ඒ අර්ථ කථනයට වැටෙන කිසිවක් ගෙනයෑමෙහි ලා සම්බන්ධ කිරීමට තනනු ලැබූ හෝ උපයෝගී කර ගනු ලැබූ උපකරණයක්

අදහස් වේ;

"විදුලි සංදේශ කාර්යාලය" යන්නෙන්, බලපත්‍රධාරියාගේ හෝ ක්‍රියාකරුවකුගේ පාලනය යටතේ හෝ පරිපාලනය යටතේ පණිවුඩ සම්ප්‍රේෂණයට ආනුෂංගික හෝ සම්බන්ධ යම් වැඩක් කර ගෙන යනු ලබන කාර්යාලයක් හෝ ගොඩනැඟිල්ලක් අදහස් වේ;

"විදුලි සංදේශ ක්‍රමය" යන්නෙන් විදුලිය, චුම්බක, විද්‍යුත් චුම්බක, විද්‍යුත් රසායනික හෝ විද්‍යුත් යාන්ත්‍රික බලය උපයෝගී කර ගැනීමෙන්—

(අ) කථනය, සංගීතය හෝ වෙනත් ශබ්ද;

(ආ) දෘශ්‍ය ඡායා;

(ඇ) මනුෂ්‍යයන්ගේ දැනගැනීම සඳහා දෘශ්‍යමාන ස්වරූපයකින් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ස්වභාවික හෝ කෘත්‍රිම භාෂාවලින්, සංකේතවලින්, වාක්‍ය ඛණ්ඩ වලින් හෝ වාක්‍යවලින්, පින්තූර වලින්, රූප සටහන්වලින් සහ චක්‍රවලින් සමන්විත තොරතුරු; හෝ

(ඈ) යන්ත්‍ර සූත්‍ර හෝ උපකරණ ක්‍රියාකරවීම හෝ පාලනය කිරීම පිණිස යොදා ගනු ලබන සංඥා

ගෙන යාමේ ක්‍රමයක් අදහස් වේ;

"විදුලි සංදේශ නිලධරයා" යන්නෙන්, ක්‍රියාකරුවකු විසින් පිහිටුවනු ලැබ ඇති, පවත්වා ගෙන යනු ලබන හෝ ක්‍රියා කරවනු ලබන විදුලි සංදේශ සේවයක් සම්බන්ධයෙන් ස්ථිර ලෙස හෝ තාවකාලිකව සේවයේ නියුක්ත කරනු ලැබ ඇති යම් තැනැත්තෙක් අදහස් වේ;



"විදුලි සංදේශ පද්ධතිය" යන්නෙන්, සම්බන්ධකයකට නිසි සන්ධි සංයෝග කිරීම මඟින්, ධ්‍රැවවල පිහිටුවා තිබෙන වෙන් කරනු ලැබූ හෝ ස්විචගත සම්බන්ධකයන් උපයෝගී කරගෙන, යම් නිශ්චිත ලක්ෂ්‍ය දෙකක් හෝ වැඩි ගණනක් අතර විදුලි සංදේශ සැපයීම පිණිස සම්බන්ධකයන් සපයන ධ්‍රැව සහ සන්ධි කට්ටලයක් අදහස් වේ;

"විදුලි සංදේශ මාර්ගය" යන්නෙන්, විදුලි සංදේශ කාර්ය සඳහා පාවිච්චි කරන්නා වූ ද, ආවරණය කර, ආලේප කර, බටයකින් හෝ නලයකින් වටකර ඇති හෝ නොමැති කම්බියක් හෝ කම්බි හෝ ඔප්ටිකල් ෆයිබර් සහ ඒවා සවි කිරීම, වෙන් කිරීම, ආරක්ෂා කිරීම හෝ පොළොවට සම්බන්ධ කිරීම සඳහා ඊට සම්බන්ධ කර ඇති යම් ආවරණයක් හෝ උපකරණයක් අදහස් වේ;

"විදුලි සංදේශ සේවය" යන්නෙන්, යම් පණිවුඩයක් විදුලි සංදේශ ක්‍රම මඟින් ගෙන යාම සංයුක්ත වන සේවයක් හෝ විදුලි සංදේශ ක්‍රමයකට සම්බන්ධ කර ඇති හෝ සම්බන්ධ කිරීමට ඇති යම් උපකරණයක් සවි කිරීම, නඩත්තු කිරීම, සැකසීම, අලුත්වැඩියා කිරීම, වෙනස් කිරීම, එහා මෙහා කිරීම, ඉවත් කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම සංයුක්ත වන සේවයක් හෝ අදහස් වේ.

**74.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875. යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.